2021 ජනවාරි
02 කාණ්ඩය 12 කලාපය
ISSN 25792369
ආධාරය රු:50/-

# FORWARD®

## සටන් කරන තාරුණ්‍යයට






# අගුල මත තැබූ විශ්වාසය

මිනිසෙකුට තවත් මිනිසෙකු පිළිබඳව විශ්වාසය නොමැති තැන අගුලකි!. වාණිජ වටිනාකම් මත පමණක් ඉදිරියට යාමට දඟලන ධනවාදය, අන්‍යෝන්‍ය සුහදතාවය තබා මිනිස් බැඳීම් පිළිබඳ කිසිවිටෙක තැකීමක් නොකරයි. සමාජයක් ඉදිරියට පැදවීමේදී මිනිසුන් එකිනෙකා කෙරෙහි ඇති විශ්වාසය කෙතරම් බලයක් වනු ඇත්ද යන්න නොතේරෙන තාක්කල් එකී සමාජය ඉදිරියට නොයනු ඇත.

කෙසේ නමුත් කොරෝනා වැනි ව්‍යසන තත්වයකදීත්, පරාර්ථකාමී මනෝභාවයකින් එයට මුහුණ දිය යුතු මොහොතකදීත් ආයතනයක් ඉදිරිපිට තබා ඇති විශබීජ නාශක දියර බෝතලයට අගුලක් දමා තැබීම, හුදෙක් මිනිසෙකුට තවත් මිනිසෙකු කෙරෙහි තැබිය හැකි විශ්වාසයේ තරම කෙතරම්ද යන්න පෙනේ. අප අද සිටින්නේ එවැනි මනෝභාවයන්ගෙන් යුතු මිනිසුන් සිටින සමාජයකය. ලැජ්ජාවට කරුණ වන්නේ අප තව තවත් රැකුල් දෙන්නේ අපේ විශ්වාසය මෙසේ අගුළු දැමූ ධනවාදයටම බැවිනි. අගුල දැමිය යුත්තේ බෝතලයට නොව, මිනිස් හැඟීම්, මිනිස් සහයෝගිතාවය, විශ්වාසය වෙනුවට වාණිජ වටිනාකමට පමණක් ඉඩ ලබාදෙමින් සැමවිට ලාභය පමණක් උපයන්නට තැත්දරන ධනවාදී පාලන තන්ත්‍රයටයි.

# කලාව අවිය කරගත් “කොරියානු සිනමාවේ නරක හාදයා” කිම් කි ඩුක්



“මම එක් කලෙක උත්සාහ කළා ප්‍රේක්ෂකාගාරයට රූපරාමු තුළ ඇති දේ පෙන්වන්න. මම වඩවඩාත් වැඩකරන විට මට ඕනෑ වුණා, ඔවුන් තිරය දෙස බලාසිටින අතරවාරයේම තිරයෙන් පිටත දේ දකින්න ඉඩ සලස්සන්න. මුල් කාලයේ මම චිත්‍රපට හැදුවේ දැකීම යනු නිතරම විශ්වාසයට ගැනීම නොවේ යන තේමාවට අනුව.”

කලාවද වාණිජකරණය වූ ලෝකයක තම සෑම නිර්මාණයක්ම පාහේ ආර්ථිකමය පාඩු ලබද්දීත් තව තව නිර්මාණ කරමින් සමාජයේ යතාර්ථය ප්‍රේක්ෂකයින්ට කියාදීමට උත්සාහ කළ ලෝ ප්‍රකට අධ්‍යක්ෂකවරයෙකු වී නම් ඒ ඔහුය. බොළඳ පෙම්කතා අලෙවියෙන් තම ගිණුම බැරකරගැනීමට අවස්ථා උපරිමෙන් තිබියදීත්, කාන්තාවන්ට සිදුවන සමාජ අසාධාරණයන්, යුද්ධය විසින් සමාජය මත ඉතිරි කරන ලද කැළැල්, මිනිසුන්ගේ ම්ලේච්ඡත්වය වැනි අතිශය ගැඹුරු, වෙනස් සංකල්ප වටා කලාව හැසිර වූ “කොරියානු සිනමාවේ නරක හාදයා” ඔහුයි. ඔහු නමින් කිම් කි ඩුක් ය.

සිනමාව පිළිබඳ පාසල් අධ්‍යාපනයක් හෝ නොලත් ඔහු, පාසල් ගමන නතරවීමෙන් පසු හමුදාවේ සහ කර්මාන්තශාලාවල වැඩකරමින් කාලය ගතකළ අතර පසුකලෙක ජාත්‍යන්තර සිනමා උළෙලවලදී වැඩිමනත් කතාබහට ලක්වූ, සිනමා කෘති රැසක් බිහිකළ අතිදක්ෂ සිනමාකරුවෙකු බවට පත්විය. තිරරචකයෙකු ලෙස සිනමා දිවිය ඇරඹූ කිම් කි ඩුක් 1996දී Crocodile චිත්‍රපටය සඳහා හොඳම අධ්‍යක්ෂණයට හා හොඳම තිරරචනයට හිමි සම්මාන දිනාගත්තේය. එතැනින් ඇරඹි ඔහුගේ ගමනට දේශීය මෙන්ම බර්ලින්, වැනිස්, කාන් වැනි අන්තර්ජාතික වේදිකා මතදීද පැසසුම් වැසි වසින්නට පටන්ගත්තේය.

බෞද්ධ භික්ෂුවක් ලෙස ඔහු ප්‍රධාන චරිතය රඟපෑ, අතිශය ප්‍රේක්ෂකාදරයට පත් වූ Spring, Summer, Fall, Winter, and Spring චිත්‍රපටය සඳහා ඔහු හොඳම අධ්‍යක්ෂණය, සංස්කරණය හා හොඳම තිරරචනයට හිමි සම්මාන දිනාගත්තේය. එසේම 2004 - 2007 දක්වා පිට පිට සිව්වතාවක්ද තවත් වසර ගණනාවකදීද දකුණු කොරියානු සිනමාවේ හොඳම අධ්‍යක්ෂණය, සංස්කරණය හා හොඳම තිරරචනයට මෙන්ම හොඳම නිෂ්පාදනයටත් හිමි සම්මාන ඩැහැ ගැනීමට තරම් අතිදක්ෂයෙකු විය. නමුත් 2020 දෙසැම්බර් මස කොරෝනා වෛරසය විසින් එම සිනමා තරුව ගිලගත්තේ ඔහුගේ නිර්මාණවල එළියෙන් පහන්වුණු ලොවපුරා සිනමාලෝලීන් කම්පාවට පත්කරමිනි.

සිනමා ක්ෂේත්‍රය තුළ මෙතෙක් බිහිවූ දක්ෂ නිර්මාණකරුවන් අතරෙන් කිම් කි ඩුක් විරල ගණයේ අතිදක්ෂයෙකු වන්නේ ඔහුගේ නිසඟ හැකියාව මෙන්ම සමාජය පිළිබඳ වූ දෘශ්ඨිය නිසාවෙනි. පෙනෙන, පෙන්වන දෙය අදහන මිනිසුන් අතර දැකීම යනු නිතරම විශ්වාසයට ගැනීම නොවන බව වන ඔහුගේ තේමාව අදටත් මතුවත් වලංගුය. කලාවේ සැබෑ කාර්යභාරය වූ සමාජ ප්‍රගමනය වෙනුවෙන් දායකවීම සිය වගකීමක් කොටගත් කිම් කි ඩුක් සිනමා ක්ෂේත්‍රය තුළ මෙන්ම ලෝකය තුළම නොමැකෙන සටහන් තබා අවසන්ය.

# ධනවාදයට ලෝක ආර්ථිකය ගොඩගන්න බැහැ. අලුත් උත්තරයක් ඕනෑ!



ජවිපෙ ප්‍රචාරක ලේකම්
විජිත හේරත්

### ලෝක පරිමාණයෙන් ආර්ථික බිඳවැටීමක් මේ මොහොතේ දක්නට ලැබෙනවා. එම බිඳවැටීම කොරෝනා නිසා ඇතිවූ තත්වයක්ද?

ලෝක ආර්ථිකය කඩාවැටෙන්නේ කොරෝනා හින්දම නෙවෙයි. කොරෝනා එන්න කලින් ඉඳලම ලෝකයේ සෑම රටකම ආර්ථිකය කඩාවැටෙමින් තිබුණා. මේ වෙනකොට ලෝක ආර්ථික වර්ධනය 3%කට බැහැලා. දියුණුයි කියන රටවලුත් එහෙමයි. ඇමරිකා එක්සත් ජනපදයේ 2018 අවුරුද්දේ 2.7%ට තිබුණ ආර්ථික වර්ධන වේගය 2019 වෙනකොට 2.4%ටත්, 2020 වෙනකොට 2.1%ටත් බැස්සා. යුරෝපා සංගමයේ 2019දී 2.9%ක් තිබුණ වර්ධන වේගය 2020දී 1.2%ට බැස්සා. මේ තත්වය ආවේ කොරොනාවලට කලින්. අද වෙනකොට ලෝකයේ රැකියා විරහිත තරුණ තරුණියන්ගේ ප්‍රමාණය මුළු තරුණ ජනගහනයෙන් 12.9%ක්. විරැකියාව එන්න එන්නම වැඩිවෙනවා. 2018දී ලෝක ජනගහණයෙන් මිලියන 185.8ක් විරැකියාවෙන් පෙලුනා. 2019 වනවිට මිලියන 187.7ක් දක්වාත් 2020දී මිලියන 190.3ක් දක්වාත් වැඩිවුණා. මේ කඩාවැටිල්ලත් එක්ක ලෝකයේ ඇති-නැති පරතරයත් එනම් සමාජ අසමානතාවයත් බරපතල විදියට වැඩිවෙනවා. කොරෝනා තත්වයත් එක්ක මේ කඩාවැටිල්ල තවත් වැඩිවෙලා තියෙනවා. ඒ කියන්නේ කොරෝනා එන්න කලින් තිබුණ ලෝක අර්ථිකය කඩාවැටීම කොරෝනා එක්ක තවත් වේගවත් වෙලා.

### 2021ට නිදහස ලබා අවුරුදු 73යි. අලුත් අයවැයකුත් ඉදිරිපත් කරලා තියනවා. රටක් විදියට අපි ගෙවමින් තිබෙන්නේ මොනවගේ තත්වයක්ද?

ලංකාවත් කොරෝනාවලට කලින්ම වැටෙමින් තිබුණා. 2020 මුල් කාර්තුව ඒ කියන්නේ ජනවාරි-මාර්තු මාස තුන තුළ කෘෂි නිෂ්පාදන 5.6%කිනුත් කර්මාන්ත නිෂ්පාදනය 7.8%කිනුත් කඩාවැටුණා. සේවා ක්ෂේත්‍රය 1.6%කින් වැටුණා. එතකොට කොරෝනා තිබුණේ නැහැ. තරුණ විරැකියාව 4.8%යි. 2019 අවසන් වෙනකොට ට්‍රිලියන 13කට ණය බර වැඩිවෙලා. 2020දී තවත් ට්‍රිලියන 3ක් ණය ගත්තා. 2021 වනවිට තවත් ට්‍රිලියන 3ක් ණය ගන්න යනවා. ඒ කියන්නේ 2021 අවසන් වෙනකොට අපේ ණය කන්ද ට්‍රිලියන 19කට ඉහළ යනවා. රුපියල් කෝටි 19 ලක්ෂයක ණයක්! 2021 අවුරුද්දේ ගෙවන්න තියන ණය පොලී වාරිකය විතරක් රු.බිලියන 2117ක් වෙනවා. ඒත් ආදායම බිලියන 1994යි. ණය පොලී වාරික ගෙවන්නත් ලැබෙන ආදායම මදියි. ඒකටත් තව බිලියන 123ක් හොයාගන්න හෙවත් ණය ගෙවන්න ණය ගන්න වෙනවා. පසුගිය අවුරුදු 10 දිගටම ආදායම් වියදම් පරතරය එන්න එන්නම වැඩිවුණා. 2019ට සාපේක්ෂව 2020 ආදායම 24%කින් අඩුවුණා. 2021දී මේ අඩුවීම තවත් වැඩිවෙනවා. අපනයන, ආයෝජන, දේශීය ඉතුරුම් වැටිලා, සංචාරක කර්මාන්තය වැටිලා, විදේශ ශ්‍රමිකයින් එවන සල්ලි අඩුවෙලා, අර්බුදය තවත් වැඩිවෙලා. අපේ රටේ ආර්ථික වර්ධන වේගය තවත් සෘණ වෙලා. මේ තත්වයෙන් රට ගොඩගන්න ආණ්ඩුවට හැකියාවක් නැහැ. පසුගිය අවුරුදු 73දීම වුණා වගේ මේ ආණ්ඩුව යටතේත් රට තවත් කඩා වැටෙනවා.

### ලෝක පරිමාණයෙන් මෙන්ම බිඳවැටෙන දේශීය ධනවාදය තුළ වාමාංශික තරුණ ව්‍යාපාරවල කාර්යභාරය සහ අභියෝගය කුමක්ද?

හරි පැහැදිලියි ගෙවුණු අවුරුදු කිහිපය තුළ ධනවාදයට ලෝක ආර්ථිකය ගොඩගන්න බැහැ කියන එක. එන්න එන්නම විරැකියාව, මන්දපෝෂණය, දුප්පත්කම වැඩිකරනවා. ඉතින් මේකට අලුත් උත්තරයක් ඕනෑ. පළවෙනි දේ තමයි මේ පවතින ධනපති ක්‍රමයට කිසිම ආර්ථිකයක් ගොඩගන්න බැහැ කියලා හරියට තේරුම්ගන්න එක. තරුණයන්ගේ ප්‍රධාන වගකීම වෙන්න ඕන ප්‍රශ්නය හරියට තේරුම්ගන්න එක. ඒකම උත්තරයෙන් සීයට පනහක් අරගෙන ඉවරයි. අද වෙලා තියෙන්නේ තරුණයෝ ගොඩක් එක්කො ජාතිවාදයට නැත්තම් ආගමික අන්තවාදයට තල්ලුවෙලා. එහෙමත් නැත්තම් මේ පරිභෝජන ආර්ථිකයේ මොකක් හෝ සෙල්ලක්කාර ගොදුරක් බවට පත්වෙලා. ඒ නිසා වාමාංශික තරුණ ව්‍යාපාරයට ඉතා බැරෑරුම් වගකීමක් පැවරිලා තියෙනවා වත්මන් තරුණ පරපුර මේ මතවාදී ව්‍යසනයෙන් මුදවාගන්න එක, ඒ අයට සමාජ අසහනය ඇතිවෙන්න බලපාන හේතු පතුලෙන්ම කියලා දෙන එක. ඒක කරන්න පුලුවන් වාමාංශික ව්‍යාපාරයකට විතරයි. එතනින් නතර නොවී රටක් විදියටත් ලෝකයක් විදියටත් මානව සමාජය වැටිලා ඉන්න මේ මඩගොහොරුවෙන් බේරගන්න නායකත්වය දෙන්න ඕනි. හැමදාම ලෝකය වෙනස් කළේ තරුණයින්. ඒ නිසා පවතින ලෝක ධනවාදී අර්බුදය, ඊළඟ සමාජ පරිවර්තනයක් දක්වා මෙහෙයවීමේ වගකීම මෙකී ව්‍යාපාරවල වගකීම වෙනවා.

### මෙලෙස බිඳවැටෙන ධනේශ්වර පාලනයන්ට එරෙහිව සමාජවාදය ගෙන ඒමේ ඉදිරි වැඩපිළිවෙල කුමක්ද ?

ලෝකයත් වැටිලා. ලංකාවත් වැටිලා. මෙහෙම කිය කිය හුල්ල හුල්ල හිටියට උත්තරයක් එන්නේ නැහැ. මේක වෙනස් කරන්න ඕනි. වෙනස් කරන්න පුලුවන්. ඉස්සෙල්ලම ඒකට හිතට ධෛර්යය ගන්න ඕන. ඊළඟට මේ පවතින වැරදි, යල් පැන ගිය සමාජ අර්ථික ක්‍රමයට එරෙහිව සටන් කරන්න ඕන. තියෙන ක්‍රමය වෙනස් කරන්න සටන් කරනවා වගේම ඒකට උත්තරයෙක් විදියට අලුත් සමාජ ක්‍රමයක් ගේන්න ඕන. තවදුරටත් මේ කුණුවෙච්ච ධනපති ක්‍රමය ඇතුළේ මේ අර්බුදයට උත්තර නැහැ. සැලැස්මක්, නිෂ්පාදනය මත පදනම් වූ ආර්ථිකයක්, ජනතා සහභාගී ආර්ථිකයක් වගේම නිෂ්පාදනයේ ප්‍රතිලාභ ජනතාවට සාධාරණව බෙදලා දෙන ආර්ථිකයක් තමයි මේකට තියෙන එකම උත්තරය!.

සියලුදෙනාටම ආර්ථිකය තුළ සාධාරණ අවස්ථාවක් ලැබෙන ක්‍රමයක් තුළ හැමෝටම නිතීය එක හා සමාන වෙනවා. අධ්‍යාපනයේ, සෞඛ්‍යයේ අයිතිය සාධාරණව ලැබෙනවා. ඒ වෙනුවෙන් විශේෂයෙන්ම වාමාංශික තරුණ ව්‍යාපාරය ශක්තිමත් වෙන්න ඕනි. ලෝකයේ අනිකුත් රටවල වාමාංශික ව්‍යාපාර සමඟ අත්වැල් බැඳගන්න ඕන. ලෝකය පුරාම විසි එක්වෙනි සියවසේ සමාජවාදයේ නැගිටීම වෙනුවෙන් මැදිහත් වෙන්න ඕනි. ඒ සඳහා හොඳම විෂයමූලික තත්වයක් ලෝකය පුරාම තියෙනවා. ලංකාව තුළත් තියෙනවා. දැන් අවශ්‍ය වෙන්නේ මනෝමූලික සාධකයට පන්නරය දීමයි. සමාජවාදි සමාජය ගොඩනැගීම ඉක්මන් කරගත හැක්කේ ඒ සඳහා වූ මැදිහත්වීමකින් පමණයි.

### අලුත් වසර ආරම්භ කරන මොහොතක අපේ රටේ තරුණ තරුණියන්ට පක්ෂයක් විදියට ලබාදෙන පණිවිඩය කුමක්ද?

අලුත් අවුරුද්දේ අලුත් විදියට හිතමු!. පරණ යල්පැනගිය දේවල් අභාවයට යවමු. නව අලුත් දේ ඒ වෙනුවට බිහිකරමු. පසුගිය කාලේ අපේ රටේ බහුතරයක් තරුණයන් බලාපොරොත්තු වුණා ගෝඨාභය ආවට පස්සේ ලොකු වෙනසක් ඇතිවෙයි කියලා. තාප්පවල චිත්‍ර ඇන්දේ ඒ තිබුණ සිහින සැබෑ කරගන්න. අවුරුද්දක් යන්නත් කලින් ඒ තාප්පවල ඇඳපු තමන්ගෙ හිත්වල තිබුණ සිහින බිඳවැටුණා. ගෝඨාභය නෙවෙයි මොන ජගතා ආවත් මේ කුණුවෙච්ච ආර්ථික ක්‍රමය ඇතුළේ මේක ගොඩගන්න බැහැ. ඒ වෙනුවට අලුත් සමාජ ක්‍රමයක් ගේන්නම ඕන. ඒකට නායකත්වය දෙන්න පුලුවන් අපේ රටේ තරුණ පරපුරට!. තමන් ඒකට සමත් නැහැ, ඒකට අපිට හයියක් නැහැ කියලා පසුගාමීව පස්සට යන්න හොද නැහැ. “හැකිනම් කරමු! නොහැකිනම්, කෙසේ හෝ කරමු!!.” වැරදි මතවාදවල ගොදුරු බවට පත්වෙලා තවදුරටත් දුක් විඳින්නේ නැතුව මේ සමාජ ක්‍රමය වෙනස් කරලා හැමෝටම හොඳට කාලා බීලා සතුටින් ඉන්න පුලුවන් සමාජයක් හදමු!. ඒ කියන්නෙ ජීවිතය විඳවන්නෙ නැතුව විඳින්න පුලුවන් සමාජයක් හදමු!. තරුණ තරුණියන් විදියට ඉස්සරහට ඇවිල්ලා වාමාංශික ව්‍යාපාරයට නායකත්වය දීලා තැලෙන, පෑගෙන, පොඩිවෙන තරුණයන්ගේ ජීවිතවලට යථාර්තයක් කරගන්න පුලුවන් සිහින සැබෑ කරමු!!.

FORWARD
සමාජවාදී තරුණ සංගමයේ මධ්‍යම පුවත්පත
464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
Tel: 0112076198
Email: syuforwardnews@gmail.com
syulanka@gmail.com
fb:syulanka
web:syusrilanka.com

# අපේ රටේ මිනිස්සු හරි වෙනස්

අද ලංකාවේ දේශපාලනයක් නැත. ඇත්තේ ගේම් එකකි. රාජපක්ෂවරු සියල්ලෝම එම ගේම් එකේදී එක පැත්තකය. එහෙත් අනෙක් සියලුම දෙනා බෙදී ඇත. ඇත්තටම පාර්ලිමේන්තුවක් කුමකටද? මේ පවුල සිටියාම හොඳටම ඇති නොවේද? විපක්ෂය දුවන්නේත් මේ පවුලේ එකිනෙකා පස්සේය. සජිත් මහින්ද පසුපස යනවිට චම්පික ගෝඨාට අඳින්නට වෙර දරයි.

ලංකාව ප්‍රතිනිර්මාණය කළ යුතුය. එසේ කිරීම පිළිබඳ සාකච්ඡාවක් ඇතිවීම වැදගත්ය. බරපතලම ප්‍රශ්නය වනුයේ රාජ්‍යය ප්‍රතිනිර්මාණය කරන්නේ කවුද යන්නය. එය ජනපති ගෝඨාභය රාජපක්ෂට කළ හැකිද? සජිත් ප්‍රේමදාසට හෝ රනිල් වික්‍රමසිංහට හැකිද? නැතහොත් ඒ සියල්ලන්ගෙන් පරිබාහිර අලුත් සමාජ ව්‍යාපාරයක් ඒ සඳහා අවශ්‍යද යන්න මෙවැනි කාලයක සාකච්ඡා කළ යුතු නොවේද? තත් සමය වනාහී සෑම අංශයකින්ම ලංකාව අගාධය කරා යමින් තිබෙන වකවානුවකි. දියේ ගසාගෙන යනවිට පිදුරු ගසේ හෝ එල්ලෙනවා විනා ප්‍රශ්නය දෙස බැලීමක් සිදු නොකෙරෙයි. ගඟේ ගසාගෙන යන ප්‍රශ්නයට මැදිව සිටින්නේ සාමාන්‍යය ජනයාය. දේශපාලන නායකයන්ට එම ප්‍රශ්නය ඒ බරින්ම අදාල නැත. මන්ද ඔවුන් සිටින්නේ ඉවුරුබඩය. ඉවුරුබඩ ඉඳගෙන ඔවුන් කරන්නේ තමන්ගේ ප්‍රශ්නයට අදාළ පශ්චාත් මරණ පරීක්ෂණයය. ලොකුම අර්බුදය වන්නේ 'රටේ ප්‍රශ්නයට' අදාළ පශ්චාත් මරණ පරීක්ෂණවලට ඒ කිසිවෙක් අත නොගැසීමය.

දැන් බන්ධනාගාරවල රැඳෙවියන්ද වෙඩි වැදී මියයන්නේය. තව බොහෝ දේ ඉදිරියේදී වීමට නියමිතය. මෙතෙක් මෙරටේ පාලකයින්ගේ හැඩය වෙනස්වූවත් ක්‍රියාව එකමය. මෙය-එයින්-මෙසේ වෙනස් යැයි තර්ක නොකර සැබෑ වෙනස හොයන්නට වෙහෙසෙමු. එසේම "අපේ රටේ මිනිස්සු හරි වෙනස් කියා"ද අප අමතක නොකල යුතුය.

සොක්‍රටීස්ගෙන් වරක් ශිෂ්‍යයෙක් මෙසේ අසයි. "ගුරුතුමනි, යුද්ධය යනු කුමක්ද?. සොක්‍රටීස් කියනුයේ "යුද්ධය ගැන නම් මම දන්නේ නැහැ. හැබැයි යුද්ධයෙන් පස්සේ ඉතිරිවන්නේ වහල් මනසක් ඇති ජඩ පිරිසක් ය." අප කොතනද සිටිනුයේ කියා අපට සිතීමට කාලය එළැඹ ඇත.

**දෙසැම්බර් 11**

## පුළුවන් අය ඉගෙනගන්න, බැරි අය නිකං ඉන්න..



මේ වන විට රටේ දූදරුවන්ගේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම අඩාල වෙලා. ඒකට ආණ්ඩුවට කිසිම වැඩපිළිවෙලක් නෑ වගේම උවමනාවකුත් නෑ කියලයි පෙනී යන්නේ. ඔන්ලයින් උගන්වනවා කියලා පුරාජේරු කිවුවට ඒවාට ඇති පහසුකමක් ළමයින්ට නෑ. ඇති, හැකි සීමිත පිරිසකට අධ්‍යාපන සීමා වෙලා. බොහෝ දරුවන්ට ඩේටා දාගන්න මුදල් නෑ. බොහෝ දරුවන්ට දුරකතනවලට සිග්නල් නැතිකම නිසා වහලවල්වලට, උස් ස්ථානවලට යන්න සිදුවී ඇති ඡායාරූප බුකිය පුරා ෂෙයාර් වෙනවා. ඒ ගැටලුව ගැන ජනතා විමුක්ති පෙරමුණ රට පුරා නගරවල විරෝධතාවයන් පැවැත්වුවා. ඔවුන් පවසන්න විදියට ආණ්ඩුවේ න්‍යාය වෙලා තියෙන්නේ "පුළුවන් අය ඉගෙන ගන්න, බැරි අය නිකං ඉන්න" කියන එක. ඒ නිසා බොරු බේගල් නැතිව අවම වශයෙන් රටේ තියන විද්‍යුත් නාලිකා උපයෝගි කරගෙනවත් මේ අධ්‍යාපන කටයුතු කරන ලෙස ඔවුන් ආණ්ඩුවට බලකරනවා.

**දෙසැම්බර් 12**

## සිංහල භාෂාවේ අලුත්ම සමාන පදය- විකිණීම හෙවත් ආයොජකයන් ගෙන්වීම

ආණ්ඩුව පත්වෙලා මාස තුනක් නැහැ, ඔන්න කොලඹ වරායේ නැගෙනහිර ජැටිය විකුණන්න කැබිනට් මණ්ඩලය අනුමත කරා කියලා බුකියේ ෂෙයාර් වෙන්න පටන්ගෙන. ඡන්දයට ඔන්න මෙන්න තියලත් මේක විකුණන්න ට්‍රයි කරා. හැබැයි වෘත්තීය සමිතිවල දැඩි විරෝධය හමුවේ ඒක වැලකී ගියා. අවසානයේ මහින්ද රාජපක්ෂ මහතා වෘත්තීය සමිති නායකයින්ව ගෙදරට ගෙනල්ලා පොරොන්දු වුණා විකුණන්නේ නෑ කියලා. රනිල්ගෙ ආණ්ඩුව චීනයට විකුණපු හම්බන්තොට වරාය නැවත ගන්නවා, මෙන්න එම්සීසී ගිවිසුම එනවෝ, රට ඉවරයි, අපිට බලය දුන්නොත් මේවා ඔක්කොම නතර කරනවා කියලා තමයි 2/3ක බලයක් ගෝඨාබය මහත්තයා ඉල්ලුවේ. 71 වසරක් රැවටුණා වගේම මෙදා සැරෙත් 69 ලක්ෂයක්ම රැවටුණා කියන එක දැන් ජේනවා. අර පොරොන්දු දුන් වෘත්තීය සමිතිවලටම දැන් වරායේ අවසන් හුස්ම ටික ගැටගහගන්න පාරට බහින්න වෙලා. සමහර වෘත්තීය සමිති නායකයෝත් රැවටෙනවා ඉවරයක් නෑ. දැන් වරාය විකුණන එකට ආණ්ඩුවේ මැති ඇමතිලා අමුතු තර්කයක් හදාගෙන. 'විකිණීමක් නෙවෙයි, මේක ආයොජකයන් කැඳවීමක් කරන්නේ' කියලා. එතකොට විකිණීමට කියන සමාන පදයක් වෙන්ඩ ඇති ආයෝජකයෝ කැඳවීම කියන්නේ?. කොහොම හරි තමන්ට ඡන්දය දුන් ජනතාවගේ හිත් සනසන්නත් එපැයි. මේ රැවටීම සැබෑවටම තේරුම්ගත්තේ නැත්නම් අපේ අනාගත පරම්පරාවට අහිමි වෙන්නේ මිල කළ නොහැකි වටිනා ජාතික සම්පතක්. ඒ නිසා පාට කණ්නාඩි ගලවලා සැබෑ දේශප්‍රේමියෙක් විදිහට බැලුවොත් කාට කාටත් මේක තේරුම්ගන්න පුළුවන් වේවි.

**දෙසැම්බර් 20**

## ස්වාමී, කාලී ශක්ති වන්දිරික්ක.... පෝඩා... පෝඩා... පෝඩා...

මේ දවස්වල බුකිය පැණියෙන් බේරෙන්න පටන් අරං. ඒ අතර කාලිමෑණියන් හීනෙන් ඇවිත් ධම්මික මේසන් බාස්ට කියපු බෙහෙත් වට්ටෝරුව කරලියට ඇවිත්. විද්‍යාත්මක උපදෙස් මොනාද? මීටරේ තියා සෙන්ටිමීටරේ දුරවත් නැති තරම් තෙරෙපි තෙරපි අසරණ මිනිස්සු පැණි



පෝලිමේ. කාලි වෙස් අරන් වට්ටෝරුව කිවුවේ ගෝඨාගේ අණ්ඩුවද කියලත් හිතෙනවා, මේකට දෙන රාජ්‍ය අනුග්‍රහය දැක්කම!. සාමාන්‍යයෙන් බෙහෙතක් හොයාගත්තම හොඳයිද නරකයිද කියලා ටෙස්ට් කරන්න ඕන ඒක ලෙඩ්ඩුන්ට දීලනේ. මේක ටෙස්ට් කරේ ආණ්ඩුවේ මැති ඇමතිවරු. දුක හිතෙන කතාව තමයි, අපේ රටේ සෞඛ්‍ය ඇමතිනියත් මේක බීලා පට්ට රසයි කියන හැඟීමක් පෙන්නුව එක. අඟහරුවල, චන්ද්‍රයා මත ජීවත්වෙන්න පරීක්ෂණ කරන ලෝකයක අපේ සෞඛ්‍ය ඇමතිලා කොහේවත් නැති කාලියකගේ පැණියක් අනුමත කරන තරමට පත්වෙලා කියන්නේ ජනතාවට අබසරණයි!. කොරෝනා වසංගතයට ආණ්ඩුවට නිසි වැඩපිළිවෙලක් නැති වුණාම ජනතාව අසරණයි තමයි!. ඒ නිසා ජනතාව බලන්නේ පිදුරු ගහෙත් එල්ලෙන්න. ආණ්ඩුවේ අරාජිකකම, වැඩ බැරිකම මේකෙන් හොඳටම ජේනවා.

**දෙසැම්බර් 22**

## රටට බිලියන 10ක් අහිමි කළ ආණඩුවේ ගජමිතුරු ගණුදෙනුව

ජවිපෙ නායක අනුර දිසානායක ආණ්ඩුවේ අලුත්ම ජාවාරම ගැන



පසුගියදා හෙළි කළා. වත්මන් ආණ්ඩුව තම ගජමිතුරන් හා එක්ව ජාවාරම් ගණනාවක් මේ වන විට සිදුකරමින් තිබෙන බව ඔහු පවසනවා. ජූනිවල සීනිවලට ගැසූ රුපියල් 50ක බද්ද, ඔක්තෝබර් වෙද්දි ශත 25 දක්වා අඩු කරලා. එයින් රජයේ භාණ්ඩාගාරයට ලැබෙන්න තිබූ රුපියල් කෝටි 1000ක ආදායම මෙම ගජමිතුරු කූට ව්‍යාපාරිකයන් අතට ලැබෙන්න සලස්වලා. එහි ප්‍රධාන ආයතනයක් තමයි විල්මා ආයතනය. එහි අයිතිකරු වියත්මගේ සංවිධානයත් සමඟ සම්බන්ධකමක්ද ඇති බව ඔහු පවසනවා. වංචාවට, දුෂණයට තිත තියනවා කියපු ගෝඨාබය ජනාධිපති හා වියත්මගේ අය අද කරන්නේ තම හිතවතුන්ගේ මනදොල පිනවීමයි කියලයි ඔහු පවසන්නේ.

**දෙසැම්බර් 23**

## "හිතුවේ සිංහබාහු පෙන්නයි කියලා-පෙන්නුවේ සාජන් නල්ලතම්බි"

ගෝඨාබය රාජපක්ෂ ජනාධිපති වී වසරක් ගතවී අවසන්. දැන් ඔහු වැඩබැරි ටාසන් වගේ කියලයි බුකියේ අය කියන්නේ. කියපු මොකුත් කරන්න බැරිවෙලා. උගතුන් වියතුන් රට පාලනය කරනවා කිවුවට ඔවුන් දැන් කැලේ. තමන්ගේ ගජමිතුරන් කිහිපදෙනෙක් සතුටු කරන තත්වයට පත්වෙලා. මහලොකුවට කිවුවේ ඩේටා බේස් එකට තමයි අපේ ලොක්කා වැඩකරන්නේ කියලා. ඩේටා බේස් නෙවෙයි, සමහර අය කියන්නේ ලොක්කා හොඳ ජනාධිපතිකමට නෙවෙයි නගරාධිපති වගේ එකකට කියලා. අර රට කරන අපේ විරුවා කියපු නංගිලා මල්ලිලා දැන් හොයන්නවත් නෑ. පරිසරය රකිනවා, හොරු අල්ලනවා, රටේ සම්පත් විකුණන්නෑ, මේක තමයි රට බේරාගන්න තියන අන්තිම අවස්ථාව කියලා දුන් පොරටොක් මතක් වෙද්දි 69 ලක්ෂයේ ජනතාව දැන් මීක් නෑ. හැබැයි ඒ වේදිකාවේ හිටපු සමහරු ඔවුන් රැවටුනා කියලා දැන් පිළිග න්නවා. එහෙම කෙනෙක් තමයි ජනක අලහප්පෙරුම මහතා. තමන් ගෝඨාබය ජනාධිපති කරන්න ගොඩක් දරදිය ඇදපු කෙනෙක්, ඒත් දැන් ජනාධිපති ගැන කලකිරිලා ඉන්නේ කියලා ඔහු සම්මුඛ සාකච්ඡාවකදී කියනවා. ඔහුගේම වචනවලින් ජනාධිපති ගෝඨාබය ගැන කිවුවේ මෙන්න මෙහෙම. "අපි හිතුවේ ගෝඨාබය සිංහබාහු පෙන්නයි කියලා, නමුත් පෙන්නුවේ සාජන් නල්ලතම්බි"

# ඔන්ලයින් නිසා ඕෆ්ලයින් වන අධ්‍යාපනය


වසරකට අධික කාලයක් තුළ ලොවම තම පාලනයට නතුකර ගත් කෝවිඩ් 19 වෛරසය මිනිසුන්ට සුපුරුදු ජීවන රටාවෙන් මිදී නව ජීවන රටාවකට හුරුවීමට බලකළේය. සංචරණය සීමාකොට මිනිසුන් නිවෙස් තුළම හුදෙකලා කළ මෙම ගෝලීය වසංගත කාලය තුළ මිනිසුන්ගේ පිහිටට පැමිණියේ තාක්ෂණයය. සංවර්ධිත රටවලට පුරුදු, සංවර්ධනය වෙමින් පවතින අප වැනි රටවලට එතරම් නුපුරුදු නිවසේ සිට වැඩකිරීම සහ ඔන්ලයින් අධ්‍යාපනය වැනි සංකල්පවලට හුරුවීමට අපටද සිදුවිය.

කොවිඩ් වෛරසය හේතුවෙන් මාර්තු මස 12 වන දින ප්‍රථමවරට මෙරට පාසල් වසා දැමුණු අතර අවස්ථා කිහිපයකදී නැවත විවෘත කළද දෙවන කෝවිඩ් රැල්ල මත පාසල් යළි වසා දැමීමට සිදුවිය. වසරේ වැඩි කාලයක් පාසල් වසා තැබීමට සිදුවීම හේතුවෙන් පාසල්වල අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යාමට අන්තර්ජාලය භාවිතා කිරීමට ආණ්ඩුව විසින් පියවර ගනු ලැබුවද මේ වන විට ඔන්ලයින් අධ්‍යාපනය මෙරට පාසල් අධ්‍යාපනය තුළ අලුතින් ගැටළු රැසක් නිර්මාණය කර ඇත.

2017 වර්ෂයේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව මෙරට රජයේ පාසල් 10,175ක් තුළ ළමුන් 4,200,000කට වැඩි පිරිසක් අධ්‍යාපනය ලබන අතර ගුරුවරුන් ගණන 250,000කට ආසන්නය. රජයේ පාසල් වුවද මෙම පාසල්වල පහසුකම් එකිනෙකට වෙනස් වන අතර ඒ මත අධ්‍යාපනයට දරුවන්ට ඇති ප්‍රවේශයද වෙනස් වන බව අපි දනිමු. එකී තත්වය ඔන්ලයින් අධ්‍යාපනය තුළද මනාව ඉස්මතුවී පෙනෙන්නක් බවට පත්ව ඇත.

ඔන්ලයින් අධ්‍යාපනය තුළ මතුවී ඇති ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීමට මෙරට පරිගණක සහ ඩිජිටල් සාක්ෂරතාව පිළිබඳ තත්වය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම වැදගත් වේ. සරලව නිර්වචනය කළවිට පරිගණක සාක්ෂරතාව යනු යම් පුද්ගලයෙකුට පරිගණකයක් භාවිතා කිරීමට ඇති හැකියාවය. නිදසුනක් ලෙස අවුරුදු 5ක කුඩා දරුවකු පරිගණක ක්‍රීඩාවක් කිරීමට දන්නේ නම් එම දරුවාද පරිගණක සාක්ෂරතාව සහිත අයෙකු ලෙස සැලකේ. ඩිජිටල් සාක්ෂරතාව යනු යම් පුද්ගලයෙකුට ඩෙස්ක්ටොප්, ලැප්ටොප්, ටැබ්, ස්මාට් දුරකථන භාවිතා කිරීමට ඇති හැකියාව වේ. මෙහිදී සලකා බලනුයේ වයස අවුරුදු 5 සිට 69 දක්වා වයස් ඛාණ්ඩයට අයත් පුද්ගලයන් පිළිබඳව වේ.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ පළමු මාස හයට අදාලව සිදුකරන ලද මිනුම්වලට අනුව මෙරට පරිගණක සාක්ෂරතාව 30.1%ක් වන අතර ඩිජිටල් සාක්ෂරතාව 44.3%කි. නාගරික ප්‍රදේශවල පරිගණක සාක්ෂරතාව 41.5% වන අතර ග්‍රාමීය ප්‍රදේශවල 28.6%ක්ද වතු ප්‍රදේශවල 13.7%ක්ද වේ. ඩිජිටල් සාක්ෂරතාව නාගරිකව 58.9% වන විට පිළිවෙලින් ග්‍රාමීය හා වතු ප්‍රදේශයන්හි එය 42.4% සහ 22.5%ක්ද වේ. පිරිමින්ගේ පරිගණක සාක්ෂරතාව 32.1% වන අතර කාන්තාවන් අතර එය 28.3%ක් වේ. එමෙන්ම පිරිමින්ගේ ඩිජිටල් සාක්ෂරතාව 48%ක් වන අතර කාන්තාවන්ගේ 41.1%කි. සිංහල කතා කරන පිරිස අතර පරිගණක සාක්ෂරතාව 36.9%ක් වනවිට ද්‍රවිඩ භාෂාව කතා කරන පිරිස අතර එය 31.2%ක් වේ. ඉංග්‍රීසි කතා කරන පිරිස අතර පරිගණක සාක්ෂරතාව 70.7%කි. පළාත් අනුව ගත්විට බස්නාහිර පළාත තුළ පරිගණක සාක්ෂරතාව ඉහළ වන අතර එය 43.6%කි. පරිගණක සාක්ෂරතාව අඩුම නැගෙනහිර පළාතේ වන අතර එය 16% කි. මෙරට ඩෙස්ක්ටොප් හෝ ලැප්ටොප් පරිගණකයක් හිමි පිරිස ජනගහණයෙන් 22.2%කි. බස්නාහිර පළාතේ 34.7%කට ඩෙස්ක්ටොප් හෝ ලැප්ටොප් පරිගණකයක් හිමිය. එහි අවමය ඌව පළාත තුළින් වාර්තා වනුයේ 12.9%ක් ලෙසිනි.



අධ්‍යාපනික මට්ටම අනුව ගත්විට මෙරට 6 ශ්‍රේණියට පහළ දරුවන් අතර පරිගණක සාක්ෂරතාව 10.2%කි. 6 සිට 10 ශ්‍රේණිය දක්වා දරුවන් 20.3% කට පරිගණක සාක්ෂරතාව ඇති අතර සාමාන්‍ය පෙළ දරුවන්ගේ එය 41.8%කි. උසස් පෙළින් ඉහළට ඉගෙන ගත් පිරිස පරිගණක සාක්ෂරතාව ඉහළම පිරිස වේ. එය 71.4%කි.

උක්ත වාර්තාවට අනුව අප රටේ අන්තර්ජාල භාවිතය 29%ක් තරම් පහළ අගයක් ගන්නා අතර නාගරිකව එය 45.5%කි. ග්‍රාමීය හා වතුකර ජනතාව අතර අන්තර්ජාල භාවිතය පිළිවෙලින් 26.5%ක් සහ 11.1%කි. අන්තර්ජාල ප්‍රවේශය සඳහා ජනගහණයෙන් 25%ක් ඩෙස්ක්ටොප් හෝ ලැප්ටොප් පරිගණක හරහා අන්තර්ජාලයට ප්‍රවේශ වනවිට 70.9%ක්ම ඒ සඳහා භාවිතා කරනුයේ ස්මාට් දුරකථනයන්ය. 2.2%ක සුළු ප්‍රතිශතයක පිරිසක් ටැබ් හරහා අන්තර්ජාලයට ප්‍රවේශ වෙති. නවතම වාර්තාවලට අනුව පවතින වෛරස තත්වය තුළ මෙරට අන්තර්ජාල ප්‍රවේශය 67.5%කින් වර්ධනය වී ඇත. නිවෙස් තුළ හුදෙකලාවීම හරහා සමාජ ජාලා පරිහරණය වර්ධනය වීම, නිවසේ සිට වැඩකිරීම සහ ඔන්ලයින් අධ්‍යාපන කටයුතු ඊට හේතුවී ඇත.

රටේ අන්තර්ජාල භාවිතය 29%ක් තරම් පහළ අගයක් ගන්නා අතර නාගරිකව එය 45.5%කි. ග්‍රාමීය හා වතුකර ජනතාව අතර අන්තර්ජාල භාවිතය පිළිවෙලින් 26.5%ක් සහ 11.1%කි.

අප ඔන්ලයින් අධ්‍යාපනයේ සාර්ථක-අසාර්ථක බව වටහා ගත යුත්තේ උක්ත පසුබිම මත සිටය. රටේ බහුතර පිරිසකට විශේෂයෙන්ම පාසල් යන දරුවන් අතර පවා පරිගණක සහ ඩිජිටල් සාක්ෂරතාව අවම පරිසරයක් තුළ ඔන්ලයින් අධ්‍යාපනය එකසේ ග්‍රහණය කරගැනීමට සියලුම දරුවන්ට නොහැකි වේ. දරුවන්ට ඒ සඳහා මග පෙන්වීමට තරම් පරිගණක හෝ ඩිජිටල් සාක්ෂරතාවක් බහුතරයක් වැඩිහිටියන්ටද නොමැත. විශේෂයෙන්ම ගුරුවරුන් තුළ පරිගණක හෝ ඩිජිටල් සාක්ෂරතාව අවමවීමත්, ඒ සඳහා අවශ්‍ය පහසුකම් නොමැතිවීමත් නිසා ගුරුවරුද අපහසුතාවයට ලක්ව සිටිති. එමෙන්ම අන්තර්ජාලයට ප්‍රවේශ වන පිරිස පවා අවමවීමත් බොහෝ ප්‍රදේශවල අවශ්‍ය යටිතල පහසුකම් නොමැති වීමත් හේතුවෙන් අනතුරුදායක ස්ථානවල සිට අන්තර්ජාලයට පිවිසීමට උත්සාහ දරන දරුවන් පිළිබඳවද පසුගිය දිනවල වාර්තා විය. නිවසේ අවම වශයෙන් ස්මාට් දුරකථනයක් හෝ නොමැති දරුවන් මෙන්ම දරුවන් කිහිප දෙනෙක් සිටින නිවසක ඇති එකම ස්මාර්ට් දුරකථනයෙන් ඔන්ලයින් අධ්‍යාපනය ලැබීමට සිදුවීමේදී දරුවන් මෙන්ම දෙමාපියන්ද පත්වන්නේ දැඩි අසරණභාවයකටය. ඇතැම් විට මව හෝ පියා සතු ස්මාට් දුරකථනය ලබාගැනීමට ඔවුන් රැකියාවට ගොස් පැමිණෙන තෙක් බලා සිටීමට සිදුවේ. තවද ඔන්ලයින් අධ්‍යාපනය සඳහා අන්තර්ජාල පහසුකම් වෙනුවෙන් අධික වියදමක් දැරීමට සිදුවීමද ඔන්ලයින් අධ්‍යාපනයෙන් බොහෝ දරුවන් පිටමන් වීමට හේතුවී ඇත. ගුරුවරුන්ටද ඔවුන්ගේ පෞද්ගලික මුදල් ඒ සඳහා යෙදවීමට සිදුවීම තුළ ඔවුහුද දැඩි අපහසුතාවයට ලක්ව සිටිති. මීට අමතරව වැඩි වෙලාවක් පරිගණක හෝ ස්මාට් දුරකථන තිර දෙස බලා සිටීම හේතුවෙන් දරුවන් අතර අක්ෂි රෝගද බහුල වී ඇති අතර අන්තර්ජාල අපයෝජනයන්ට ලක්වීමේ වැඩිවීමක්ද සිදුවී ඇත.


එසේ නම් වසංගතයකට දරුවන්ගේ අධ්‍යාපනය බිඳ දැමීමට ඉඩ නොදී නව විකල්ප ඔස්සේ දරුවන්ට ඉගැන්විය යුතුය. නමුදු එය කිසිසේත් දරුවන් පිරිසක් අධ්‍යාපනයෙන් පිටමං කරන්නක් නොවිය යුතුමය!. මන්ද නෙල්සන් මැන්ඩෙලා පැවසූ අයුරින් ලොව වෙනස් කිරීමේ ප්‍රබලම අවිය අධ්‍යාපනය වන බැවිනි.

# මිකැනික්ලාට සැත්කම් බාර දී රටට වෙච්ච දෙයක්!

දිනෙන් දිනම කළු පැහැ ගැන්වෙන අගමැති මහින්ද රාජපක්ෂගේ කෙස් කළඹට සාපේක්ෂව ඔහුගේ බාල සොයුරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ පැසුණු, සුදු කෙස් කළඹ ඔහුට යම් පැසුණු, පරිනත බවක් පෙන්නුම් කරයි. ඒ සමගම අපගේ සිහියට නැංවෙනුයේ "පැසුණු හිසින් බුහුමන් ලබව" යන පැරණි කියමනය. එහෙත්, ජනාධිපතිවරයාගේ කතාබහ සහ ක්‍රියාකලාපයන් සියුම් ලෙස නිරීක්ෂණය කරන්නකු හට මනාව පැහැදිලි වන දෙයක් තිබේ. එනම් ඔහුගේ හිසේ මතුපිටින් දක්නට ලැබෙන පැසුණු බව "හිසේ ඇතුළත" නම් නැති බවයි.

මතවාදීමය තලයේදී ගෝඨාභය රාජපක්ෂ යනු පැසුණු බුද්ධියක් ඇති මහා පොරකි. "කිව්වොත් කිව්ව දේ කරන මිනිහෙක්, ගෝඨාත් එක්ක සෙල්ලම් බෑ, දූෂිතයන්ට අවස්ථාවක් ලැබෙන්නෙම නැහැ, සියලු ඥාති සංග්‍රහවලට ඉඩ නොලැබේ, ජාතිවාදීන්ට නම් සෙල්ලම් කරන්න බෑ, විවේචනය නොකරන, වැඩ විතරක් කරන, රටේ සම්පත් නොවිකුණා ආරක්ෂා කරන, පරිසර හිතවාදී, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන, රටේ ආර්ථිකය ගොඩගන්න, smart තාරුණ්‍යය වෙනුවෙන් දැක්මක් ඇති, රටේ ආර්ථිකය ගොඩනැංවීමට සිටින එකම පුද්ගලයා" ලෙස මහා දැවැන්ත පෞරුෂයක් ගොඩනගා ගත් නමුත් පැසුණු හිසකෙස්වල ගෞරවයවත් ආරක්ෂා කරගැනීමට නොහැකි වූ අසාර්ථක නායකයෙකු ලෙස සමාජගත වී හමාරය. ඔහුගේ අසාර්ථකත්වය ඔහු වෙනුවෙන් ගොඩනැඟූ මතවාදී තලයෙන්ම ලිහාගැනීම සුදුසුය.

බිඳ වැටුණු ආර්ථිකය ගොඩගන්න ආ පැසුණු හිසකේ සහිත ඒ නොමේරූ මිනිසාගේ දැක්මක් නොමැතිකම විසින් රට දැවැන්ත අර්බුදයකට ඇදගෙන යමින් තිබේ. දැන් දැන් එය සාධාරණීකරණය කිරීම සඳහාද මතවාදයන් ගොඩනගයි. "රට හදන්න බැරි මහින්ද හින්දා, මහින්ද තමයි දූෂිතයන් එකතුකරගන්නේ" යන මතවාදයන් සමාජගත කරයි. නමුත් ජනාධිපතිවරණ සමයේ රට ගොඩනගන්න මුදල් හොයන්නෙ කොහොමද යනුවෙන් මාධ්‍යවේදීන් ප්‍රශ්න කළ විට ගෝඨාභය බැලුවේ මහින්දගේ මූණය. මහින්ද සිටියේ




අපි කෙසේ හෝ සල්ලි හොයා ගන්නා තැනය. දැක්මක් නොමැති ගෝඨා දැන් බැස ඇත්තේ 'කෙසේ හෝ' සල්ලි හොයාගැනීමේ ගේමටය.

රටේ සම්පත් රකින්නට ආ විරුවා වූ ඔහු කොළඹ නැගෙනහිර ජැටිය ඉන්දියාවේ අදානි සමාගමටත්, මැනිං මාර්කට් එක ළඟ අක්කර 7ක ඉඩමත්, මුත්තයියා පාරේ ඉඩමත්, බොරැල්ල මාර්කට් එක ළඟ ඉඩමත්, චීනයට විකිණීමට කටයුතු කරමින් සිටී. මත්තල, ඇමරිකන් ස්කයි සමාගමට විකිණීමට සාකච්ඡා කරමින් තිබේ. දැන් දැන් දේශප්‍රේමීත්වයත් අධිරාජ්‍ය විරෝධයත් දේශීය සම්පත් ආරක්ෂා කරගැනීමත් රෙද්ද පල්ලෙන් බේරීමට පටන්ගෙන තිබේ.

මහජන උපයෝගිතා කොමිසම පිහිටවූයේ විදුලිය, ජලය සහ බලශක්ති යන අංශවල රාජ්‍ය ඒකාධිකාරය විසින් ගනු ලබන අසාධාරණ තීරණවලින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහාය. අසාධාරණ මිල ඉහළ දැමීම් වලින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහාය. පී. බී. ජයසුන්දර විසින් එය අහෝසි කර දමන්නේ ගෝඨාභයව මෙන්ම පාර්ලිමේන්තුවද තුට්ටුවකට ගණන් නොගනිමිනි.

ගෝඨාගේ පරිසර ආදරය මැතිවරණ සමයේදී කැපී පෙනුණේය. පෝස්ටර් ගැසීම පරිසර හානියක් ලෙස සමාජගත කර තාප්ප ගානේ චිත්‍ර ඇඳීමට තරුණයන් යොමු කළේය. මැතිවරණ රැස්වීම් අවසානයේද පැළ බෙදීය. පරිසරයට ආදරය කරන, සැබෑ පරිසර හිතවාදියෙක් ලෙස රටේ ජනතාව ගොනාට අන්දවා බලය ගත් දැන් ඔහුගේ ප්‍රේමයේ තරම දැන් පෙනෙමින් තිබේ. අම්පාර දිස්ත්‍රික්කයේ රක්ෂිතය ඇතුළු පරිසර පද්ධතිය විනාශ කරමින් තම ගජ මිතුරන්ට ව්‍යාපාර කිරීමට ලබා දී ඇත. හම්බන්තොට වන අලි කළමනාකරණ බලප්‍රදේශය නීත්‍යානුකූල නොකර එහි කැලෑ ඉඩම් ටික මහා පරිමාණ ව්‍යාපාරිකයන්ගේ මනදොළ පිරවීමට ලබාදී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස අහිංසක ගම්මාන වැසියන්ගේ ජීවිත දේපළ හා වගාවන් අලින්ගේ ග්‍රහණයට ලක්ව තිබේ. ගෝඨාභය බලයට ඒමේ ප්‍රධාන සටන් පාඨයක් වූයේ විල්පත්තුවය. ඔහු විල්පත්තුව විනාශ කළ බදුර්දීන්ට කිසිවක් කළේ නැත. පරිසර සංවිධාන විසින් නඩු දමා යම් හෝ සාධාරණයක් ඉටුකරගත්තා මිස ඒ වෙනුවෙන් කිසිවක් නොකළේය. ආනවිලුන්දාව තෙත් බිම් ඩෝසර් කිරීම, සිංහරාජය මැදින් පාර කැපීම, ගෝඨාභයගේ පරිසරයට ප්‍රේම කිරීමේ අසාර්ථකත්වය පෙන්වන්නකි.

මිකැනික්ලාට සැත්කම් බාර දී අනාගත් "මේජර් ජෙනරාල්" ප්‍රොජෙක්ට් එක හා වියත්මගේ නොපැසුණු භාවිතාව ගෝඨාභයගේ අසාර්ථකත්වයේ එක් කැඩපතක් විය. මිනිස් සිරුරක ඇතුළත සහ මෝටර් වාහනයක ඇන්ජිම කිසියම් අයුරකින් සමාන යැයි යමකුට හැඟී යා හැක. එහෙත්, මෝටර් කාර්මික ශිල්පයේ කවර හෝ විශේෂඥයකුට වුව කාරයක බොනට්ටුව මෙන් මිනිස් සිරුරක් විවර කොට සිදුකරන සැත්කමක වගකීම පැවරිය හැකිද? ඒ අසාර්ථක ව්‍යාපෘතියටද ගෝඨාභය "සාර්ථක" ලෙස මුලපුරා තිබේ. පරිපාලන ක්ෂේත්‍රය පිළිබඳ න්‍යායාත්මක, විද්‍යාත්මක දැනුමක් අවබෝධයක් සහිත ඒ සම්බන්ධ පළපුරුද්දක් හිමි පරිපාලන සේවා ප්‍රවීණයන් පසෙකට දමා ගෝඨාභය විසින් පරිපාලන තනතුරුවලට පත්කරන ලද යුද හමුදා මේජර් ජනරාල්ලා සියල්ලන්ම මේ වන විට තමන්ට බාරදුන් කිසිදු කාර්යයක් සාර්ථකව කරගැනීමට නොහැකිව "ෆේල්" වී ඇත.

රටට සෞභාග්‍ය ගෙන එනවා කියා බලයට ආ "වැඩ කරන විරුවා" ගෝඨාභය රාජපක්ෂ බලයට පත්වීමෙන් වසරකට පසු ඉතිහාසයේ පළමුවරට ශ්‍රී ලංකාව නිල වශයෙන්ම "බංකොලොත් රටක්" බවට පත් කර තිබෙන බව සාතිශය සංවේගයෙන් යුතුව වාර්තාකිරීමට සිදුව තිබේ.




"නිදාගන්න තැනක් නෑ. පොරවන්න රෙද්දක් නෑ. බල්ලෙක්ට වඩා නරකයි. මම මෙතනම මැරිලා යයි. දෙවියන්ගේ නාමයෙන් සීයෙ ඇවිත් මාව මෙහෙන් අරං යන්න. ඉක්මනට එන්න සීයෙ. මම ඔයාගෙ කකුල් දෙක වැඳලා ඉල්ලන්නේ!"

ඔට්ටාල් චිත්‍රපටය 2015 වසරේ නිර්මාණය කළ සිනමාපටයක් වන අතර මෙහි කතා තේමාව ප්‍රවීණ සෝවියට් ලේඛක ඇන්ටන් චෙකොෆ්ගේ "වන්කා" කෙටිකතාවේ අනුවර්තනයකි. මෙහි පිටපත ජොෂි මංගලන් විසින් රචනා කර ඇත. ඔට්ටාල් යන මලයාලම් වචනයේ සිංහල තේරුම වන්නේ "උගුල" ය. මෙම සිනමා පටය 2015 වසරේදී කේරළ ප්‍රාන්තයේ හොඳම මලයාලම් සිනමාපටය ලෙස සම්මාන දිනූ  අතර ඊට අමතරව තවත් සිනමා උළෙලවල් කිහිපයකදීම සම්මාන ලැබූ සිනමාපටයකි. මලයාලම් සිනමාවේ සම්මානනීය අධ්‍යක්ෂකවරයෙක් වන ජෙයරාජ් විසින් මෙය අධ්‍යක්ෂණය කළ අතර ප්‍රධාන චරිතය වන කුට්ටප්පායි ලෙස ළමා නළු අශාන් කේෂාන් රංගනයෙන් දායක වන අතර සීයා වන වල්ලිප්පායි ලෙස කුමාර් කොම් වාසුදේවන් රංගනයෙන් දායක වේ. සිනමාපටය පුරාම ප්‍රේක්ෂකයන් වෙත කේරලයේ අසිරිමත් බව සහ මනරම් පරිසරය පෙන්වීම සඳහා අධ්‍යක්ෂකවරයා උත්සාහ ගෙන ඇති අතර කේරළයේ කළපු පරිසරය ආශ්‍රිත ධීවර ප්‍රජාවගේ සහ තාරා ගොවිපලක් වටා මෙහි කතා තේමාව ගොතා ඇත.

අප ළමා චිත්‍රපට කොතෙකුත් නරඹා ඇතත් මෙම චිත්‍රපටය, අනෙකුත් ළමා චිත්‍රපටවලට වඩා බොහෝ වෙනසක් සහිතව ප්‍රේක්ෂකයා වෙත ගෙනහැර පෑමට අධ්‍යක්ෂකවරයා සමත් වී ඇත. අප දැක ඇති ගම කේන්ද්‍ර කරගත් සමාජයක් පිළිබිඹු වෙන ගම්බද දරුවන් පාදක කරගත් බොහෝ සිනමාපට දිගහැර තිබුණේ ගම්බද දරුවන් දුක උරුම කර ගත් පිරිසක් බවත් ඔවුන්ට ඇති අඩු පහසුකම් මත එම දරුවන් ජීවිතය ජයගන්නා තේමාවන්ය. මේවා ග්‍රාමීය මූලයන් සහිත මැද පන්ති මනෝභාවයක් සහිත ඒත් යම් මට්ටමක අධ්‍යාපන පසුබිමක් සහිත නාගරික හෝ අර්ධ නාගරික දෙමව්පියන් තම දරුවන්ට ගම පෙන්වීම පිණිස උපයෝගී වූ නිර්මාණ විය. නැවත ගමට යාමට නොහැකි හා අකමැති මොවුන්ට ස්වෝත්සාහයෙන් තම ජීවිත ජයගත හැකි යන මනෝභාවය තම දරුවන්ට එන්නත් කිරීමට අවශ්‍ය විය. තමන් ගැන පමණක් සිතන අනිත් දරුවන් තම දරුවන් ලෙස නොසිතන සමාජයකට නිතර අවශ්‍ය වූයේ තමන්ගේ උත්සාහයෙන් තනි ජයග්‍රහණ ලබාගැනීමටය. අප දන්නා බොහෝ ළමා සිනමාපටවල අඩංගුව එය විය. නමුත් ඔට්ටාල් එම තේමාවන්ගෙන් අපගමනය වූවකි.

කුඩා කලදීම මව්පිය දෙදෙනාම අහිමි අට හැවිරිදි දරුවෙකු වටා ගෙතී ඇති මෙම සිනමාපටය විසින් ලෝකයේ දරුවන්ගේ සමාජ යථාර්ථය හරි අපූරුවට ප්‍රතිනිර්මාණය කිරීමට කුට්ටප්පායිගේ චරිතය හරහා ජේරාජ්ට හැකිවේ. ඔහු මෙතුළින් යථාර්ථය ප්‍රතිනිර්මාණය කිරීමට උත්සාහ කර තිබෙන අතර කුට්ටප්පායි වැනි දරුවන්ට පවත්නා ලෝකය ජීවත්විය හැකි තැනක් දැයි සිනමාපටය පුරාම ප්‍රශ්න කෙරේ. දරුවන් කොහොමත් දැනට ලොව සිටින අව්‍යාජම පරිසරවේදීන් වේ. ඔවුන් අතින් පරිසරයට හානි සිදුනොවන තරම්ය. එවැනි පරිසර ගර්භයක පෝෂණය වන දරුවන්ගේ නිර්මාණශීලී බව මෙම සිනමාපටය පුරාම කුට්ටප්පායි චරිතය තුළින් සමාජයට උකහා ගත හැක. අදූෂිත හදවත් ඇති දරුවන් තුළ ඇති පරිත්‍යාගශීලී, අවංක, සංග්‍රහශීලී බව පිළිබඳව ඔහුගේ මිතුරු ටිංකු කෙරේ කුට්ටප්පායිගේ මිතුදමින් මනාව පිළිබිඹු වෙයි. සියලු වරප්‍රසාද අහිමි වූවත් කිසිදු වෛරයකින් තොරව කුට්ටප්පායි තමන්ට ඇති හොඳම දෙය කිසිදු ලෝබකමකින් තොරව තම හොඳම මිතුරාට පරිත්‍යාග කිරීම සඳහා කිසිදු පැකිලීමකින් තොරව ඉදිරිපත්වේ. තමන්ගේ මිතුරා මුහුණදෙන ඕනෑම අසීරු මොහොතකදී පවා මෙම කුඩා දරුවා අව්‍යාජව ඉදිරිපත් වේ. මෙහිදී කුට්ටප්පායි වැනි දරුවන්ගේ ජීවත්වීම සහ පාසල්යාමට ඇති අයිතිය ප්‍රශ්න කරන්නේ මුළු ප්‍රේක්ෂකාගාරයම කුට්ටප්පායි වෙත ඇඳබැඳ තබමින්ය.

මෙහි එක් තැනක කුට්ටප්පායිගේ සීයා වන වල්ලිප්පායි "කුට්ටප්පායි ජීවිතය ඉගෙනගන්න!" යැයි පවසයි. මෙහිදී වල්ලිප්පායි තම වයස සහ අසනීප තත්වය හමුවේ අසරණ වන අතර කුට්ටප්පායිගේ අනාගතය ගැන බිය වන ඔහුට අනාගත ජීවිතයට මුහුණදීම සඳහා කුට්ටප්පායිව ළමා ශ්‍රමිකයෙකු ලෙස සමාජගත කිරීම හැර කළ හැක්කක් නොවීය. ඔහු දන්නා පරිදි මිහිපිට ඇති කුට්ටප්පායිගේ එකම ඥාතියා තමා වන අතර කිසිවකු කුට්ටප්පායි රැකබලාගැනීමට හෝ ආදරය දැක්වීමට නොසිටියේය. හැකි අය සිටියත් ඔවුන් පවසනුයේ අපි අපේ පවුල බලාගතයුතු බවය. පිරිසක් බලා සිටිනුයේ කුට්ටප්පායිලා වැනි අසරණ දරුවන් භාවිතා කර කීයක් හෝ සොයාගැනීමටය. දරුවෙකු රැකබලාගැනීම වෙනුවට විකුණාකෑම සමාජගත වූ ලෝකයක කුට්ටප්පායිලා අත් නොහැර රැකබලාගන්නා ආදරය පිරුණු මානව සමාජයක අවශ්‍යතාවය අද ඉතා වලංගුය. නොනවත්වා හැල්මේ දුවන ප්‍රාග්ධන යන්ත්‍රයක් තුළ දරුවන්ට පමණක් නොව සමස්ත මානව සමාජයට ආදරය කිරීමට නොහැකි බවත් ප්‍රාග්ධන සමාජයෙන් මානව ප්‍රජාව මුදාගැනීම කළ යුතු නොවේද යන පැනයත් ඔට්ටාල් මනාව ගෙනහැර පායි.

## සරදියෙල්ගේ කොලම

*2020 නම් කිරියෙන් පටන් අරන් පැණියෙන් ඉවර උනා, සර්ට පින්සිද්ද වෙන්න!. 2021 මොන ගිණි විජ්ජුම්බරයක් කරයිද කියලයි සරදියෙල්ට බය. සරදියෙල්ට හොඳට මතකයි සර් පටන් ගද්දි බහුතරේ කිරිබත් කාපු කෑම. ඒත් දැන් නම් සර් ගැසට් ගහන ගැහිල්ලටයි ඒවා රිවස් කරන කිරිල්ලයි අතර තියෙන කාල ගැප් එකේ, කිරිබත ඉදව ගන්නවත් වෙන්නේ නෑ. අනික දැන් හාල් සේරුවේ ගාණයි, පොල් බෑයේ ගාණයි හැටියට, කිරිබතක් උයනවා කියන්නේ ආයේ ලේසි පහසු වැඩක් එහෙම නෙමෙයි ඕං......*

*"යෝධයෙක්ගේ නමක් තිබ්බට, මේක කරන්නේම සද්ද විද්ද පරම්පරාවෙම වැඩනේ ආයිබොවන්ඩ!" රාජ්‍ය සේවයේ ඉඳලා පැන්ෂොන් ගියපු සීයා කෙනෙක් සරදියෙල් එක්කලා කද්දේට සෙට් උනා. "මොකෑ සීයේ උඹ එහෙම කිව්වේ?" සරදියෙලුත් ලූණු ඇඹුල් ඇතුවම අහගන්ට හිතාන හූ මිටි තිබ්බා.*

*"ඇයි බන් සරදියෙල්, උඹ දැක්ක නැතෙයි, අර ජරාව අරන් මාට්ටු උන සෙට් එකකට කළ දේ?"*

*"නෑනේ, එකත් එකටම වැඩ තහනම් කරෝලා, අල්ලස් එකට දෙන්න ඇති පරීක්ෂණ කරන්න."*

*"ඔය කිව්වේ!, අන්න උන්ගේ ආයතනේ මාරු කරලා, මුල ඉඳන් ආයේ වැඩේ කරන් යන්න කියලා තියෙන්නේ."*

*"පිස්සුද සීයේ? සර් එක්ක සෙල්ලම් බෑ, එච්චා කොහෙද?"*

*"එහෙම තමයි බං අපිත් හිතුවේ. ඉගිල්ලෙනකොටනේ කන කොකාගේ සුද පේන්නේ. මං උඹට වතාවකුත් කිව්වේ. මේකගේ නම යෝධයෙක්ගේ, වැඩ අන්දරේගේ කියලා. අනෙක උඹ කිව්වා වගේ, අල්ලස් කොමිසමට දුන්නත් වැඩක් නෑ. ඒකේ ලොක්කත්, මේකගේ පූට්ටුවේ හිටපු සංවිධායකයෙක්ලුනේ."*

*"කාලි අම්මටම ඔප්පු වෙච්චාවේ! ඒකත් එහෙමෙයි?."*

*"ඔව් බාං... අන්න මහජන උපයෝගීතාවයත් නැති කරලම දාලා. 20 හොඳයි කියලා හිතුණාට, මෙච්චර හොඳ වෙයි කියලා හිතුවේ නෑ."*

*"නුඹ නාඩං! නුඹ නාඩං සීයේ!. නුඹට ඔච්චා හොඳ පාඩම්!!"*

*"උඹ මට කෝචොක් කරනවා නේ?"*

*"කෝචොක් නෙමෙයි සීයේ. උඹලා තමයි මෙච්චට වගකියන්න ඕනි. අපි හම්බකර ගත්තොත් අපි කෑවා කියලා, අපේ කොල්ලො කෙල්ලන්ටත් කිය කිය, මාරුවෙන් මාරුවට එකම සෙට් එකකට දිදී, ටික දවසකින් බනිනවා. මට දුක උඹලා ජානවලින්ම අපේ කොල්ලෝ කෙල්ලො වැඩි හරියකටත් ඔය ලෙඩේ දීලා තියෙන එකට."*

*"ආයේ නම් රැවටෙන්නෑ බොලං සරදියෙල් කොල්ලෝ"*

*"අනේ නිකන් ඉඳින් සීයේ. ඊළඟ පාර ඔය සෙට් එකේ එකෙක්ම එළියට බැහැලා, නන්දසේනට බැන්නම, උඹලට ඌව වීරයා වෙනවා. ඒක තමා රට බේරගැනීමේ අවසන් අවස්ථාව වෙනවා. ඌට තමයි රාජයෝගේ තියෙන්නේ කියලා හිතනවා. ආයේ කෙලිනවා අර ගෝනි පඩංගුව අස්සට ගිහිල්ලා. මාව සුද්දා එල්ලලා මරන වෙලේ මං උන්ට කිව්වෙත්, අපේ ලක් අම්මාට, මං වගේ පුත්තු 10ක් හිටියා නම්, උඹලට මෙහෙම මේ රට හූරගෙන කන්න හම්බෙන්නෑ කියලා. මිනිස්සුන්ගේ දුක තේරෙන අවංක මිනිස්සු හිඟයි. හැබැයි උන් සැරයි!. ඕන් බලපං සීයේ, උඹලාගේ කාලේ දැන් ඉවර වේගෙනයි යන්නේ. සරදියෙල් පරපුරේ කොල්ලෝ ලෑස්තියි බැටේ දෙන්න. උඹලා පත් කරපු හොරුන්ට!"*

නූතන පරපුරේ

සරදියල්

# ධනවාදයේ අර්බුදය වැඩිවෙන්න වැඩිවෙන්න පාලකයොන්ට සොබාදහම පේන්නෙ රුපියල් හා ඩොලර් විදිහට



සමාජවාදී තරුණ සංගමය ජාතික කමිටු සාමාජික
සංජය විශ්වනාත්

**සමාජවාදී තරුණ සංගමය පරිසරය ගැන ඇයි මේ තරම් සැලකිල්ලක් දක්වන්නේ? එය දේශපාලන ව්‍යාපාරයක තරුණයන් වන ඔබලාට අයිති කාර්යයක් නෙවෙයි නේද?**

forward එකට ස්තූති කරනවා මේ වගේ මාතෘකාවක් සාකච්ඡා කරන්න හිතපු එකට. මුලින්ම කියන්න ඕන අපි දේශපාලන ව්‍යාපාරයක්. අපේ කාර්යය තමා අවුරුදු 72ක් තිස්සේ අසමත් කියලා ඔප්පු කරපු වයෝවෘද්ධ ධනවාදය වෙනුවට නවමු සමාජවාදී සමාජයක් ගොඩනගන එක. ඒ සමාජ කාර්යය අපි හෙට දිනයේ ජයග්‍රහණය කරත්, ඒ සඳහා තව ලොකු කාලයක් ගත වුණත් අපිට ඒ නවමු සමාජය ගොඩනගන්න වෙන්නෙ මේ මහපොළොව මත. ඉතින් ඒ මහ පොළොවෙ මිනිස්සු ඉන්න ඕන. මිනිස්සුන්ට ඉන්න පුලුවන් වෙන්නෙ මේ ගහකොළ රැකුණොත්, මේ සතාසීපාවනුත් ආරක්ෂා වුණොත් විතරයි. ඒ නිසා අපේ කාර්යය තමයි සමාජය වෙනස්කරන ගමන් මේ අසමත්, සිත්පිත් නැති ධනවාදයෙන් පරිසරය ආරක්ෂා කරගන්න එක. ඒ නිසා තරුණ අපි හිතනවා පරිසරය රැකගැනීමේ සටන අපිට අත්හළ නොහැකි කාර්යයක් කියලා.

**පරිසරය ආරක්ෂා කරන්න විශාල මතවාදයක් නියෝජනය කරපු වත්මන් ආණ්ඩුව දැන් විශාල වශයෙන් පරිසරය විනාශ කරනවා. මේ මොහොත වනවිට අපේ රටේ පරිසර පද්ධතිය මුහුණ දී ඇති තත්වය කුමක්ද?**

අපි දන්නව මේ වෙද්දී අපේ රටේ තිබුණු වනගහණයෙන් 17%ක් වගේ කුඩා පංගුවක් විතරයි ඉතිරිවෙලා තියෙන්නේ. ඒකෙන්ම පේනව නේද අපේ රටේ හිටපු හැම පාලකයෙකුගෙම කෙරුවාව?. මේ ආණ්ඩුවත් බලයට ආවේ පරිසරය ආරක්ෂා කිරීම ගැන විශාල මතයක් ගොඩනගමින්. 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තියනවා ජාතික වනවැස්ම 30%ක් දක්වා වර්ධනය කරනවා කියලා. නමුත් මේ ආණ්ඩුව පත්වුණ දවසෙ ඉඳන්ම පරිසර විනාශය වේගවත් කරන ක්‍රියාමාර්ග තමයි ක්‍රියාත්මක කරේ. පටන්ගත්තෙම වැලි ප්‍රවාහන බලපත්‍ර ලබාගැනීමේ නීතිය ඉවත් කරලා.

ඒවගේම 1/2020 චක්‍රලේඛය ගේන්න මේ ආණ්ඩුව උත්සුක වුණා. 2020.11.04 දින වනසංරක්ෂණ ජෙනරාල්වරයා විසින් ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම්වරුන්ට යවන ලද ලිපියකින් කියනවා ඔහු සතුව තිබූ 05/2001 හා 02/2006, 02/02/03/301, 05/98 යන වනසංරක්ෂණ චක්‍රලේඛ සියල්ල බල රහිත බවත්, මෙරට ඇති අත්‍යවශ්‍ය අනෙකුත් වනාන්තර පිළිබඳ තීරණගැනීමේ අයිතිය ප්‍රා.ලේ හා දි.ලේ යන තනතුරුවලට අයිති වන බවත්. ඒ වනතෙක් වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව තිබුණු අත්‍යවශ්‍ය අනෙකුත් වනාන්තර 1/2020 චක්‍රලේඛය මගින් අහෝසි කරා. මේ චක්‍රලේඛයෙන් "අත්‍යවශ්‍ය අනෙකුත් වනාන්තර", "අවශේෂ කැලෑ" ලෙස හුවා දක්වමින් මේ සැරසෙන්නේ අපේ රටේ 17%ක වනගහණයෙන් 5%ක් වන අත්‍යවශ්‍ය අනෙකුත් වනාන්තර එළිපෙහෙළි කරලා ඒ හා බැඳි පරිසර පද්ධතිය විනාශ කරන්න. ඒක දැන් වෙමින් තියෙනවා.

**අපේ රටේ පරිසර පද්ධතිය ගැන ජනතාව හා ආණ්ඩු හිතන ආකාරයේ ගැටලුවක් තියෙනවා නේද? මෙයාකාර ඉරණමක් පරිසරයට ඇතිවීමට එය බලපා තියෙනවද?**

ඔව් ඇත්ත. අපේ රටේ පරිසර පද්ධතිය ගැන පත්වුණු වගේම, දැන් තියන ආණ්ඩුවත් හිතන විදිහේ අවුලක් තියෙනවා. ගොඩගන්න බැරි ආර්ථික අර්බුදයක මේ ආණ්ඩුව හිරවෙලා ඉන්නවා. ඒක මේ අයවැයෙන් හොඳටම පේනවා. ආණ්ඩුව කල්පනා කරනවා ඒ අර්බුදයෙන් ගොඩඑන්න අපේ රටේ තියෙන ස්වභාවික සම්පත් ටික විකුණන්න. ධනවාදයේ අර්බුදය වැඩිවෙන්න වැඩිවෙන්න පාලකයොන්ට සොබාදහම පේන්නෙ ඩොලර් හා රුපියල් විදිහට. ඒකෙන් වෙන්නෙ මේ වනවැස්ම එන්න එන්නම ක්ෂය වන එක. ඉහතදී කියපු චක්‍රලේඛය ගේන්නෙම ඒ උවමනාවට.

මේ ආණ්ඩුව බලයට එන්න කලින් පරිසරය වෙනුවෙන් හඬ නගන, පරිසරය ලස්සන කරන්න චිත්‍ර ඇඳපු ලොකු රැල්ලක් හැදුවා. හිතාගන්න බෑ දැන් මෙච්චර පරිසර විනාශයක් වෙද්දී ඒ ජනතාව, තරුණ තරුණියෝ කටක්වත් අරින්නැතුව උපේක්ෂාවෙන් මේ විනාශය දරාගෙන ඉන්නෙ කොහොමද කියලා.. තමන් කැමති කෙනා බලයේ ඉද්දී පරිසර විනාශය නොපෙනෙන්නත්, බලය නැති වෙලාවෙ පරිසරයට දැඩි ලෙස ආදරය කිරීමත් අතර විශාල පරස්පරයක් තියෙනවා. ඉතින් මේ අදූරදර්ශී පාලකයොන්ට, ජනතාවට පරිසරය පිළිබඳ තියන ආකල්ප මේ පරිසර විනාශය වේගවත් කරන්න බලපානවා.

**මිනිසාගෙන් තොරව පරිසර පද්ධතියක් පැවතිය හැකිද? පරිසර හානියකින් තොරව රටක් සංවර්ධනය කරන්න පුලුවන්ද?**

මානව පරිණාමයේදී මානවයා සොබාදහම ජයගත්තා. අනාගතයේදීත් මිනිස්සු සොබාදහමට පරදින්න ඕන වෙන එකක් නෑ. නමුත් මිනිසාට පවතින්න පරිසරය ඕන උනාට පරිසරයට පවතින්න මිනිස්සු ඕන වෙන්නෑ. ඒ ගැන කල්පනා කරමින් රටක් සංවර්ධනය කරන්න ඕන. පරිසර විනාශයකින් තොරව රටක් සංවර්ධනය කරන්න පුලුවන්. ලෝකෙ එහෙම කරමින් ඉන්නවා.

උදාහරණයකට, අද ලෝකෙ බොහෝ රටවල් සූර්ය බලශක්ති නිෂ්පාදනයට මාරුවෙලා තියනවා. ඒ සඳහා බිල්ඩින්වල වහල, උස් ගොඩනැගිලිවල බිත්ති, මාර්ගවල වටරවුම් පවා යොදාගන්නවා සූර්ය පැනල හයිකරන්න. නමුත් අපේ රටේ හම්බන්තොට සූර්ය බලාගාරයක් හදලා තියනවා සම්පූර්ණයෙන් කැලේ කපලා. ඉතින් ඒ සංවර්ධනය වැරදියි නේද? සංවර්ධනය කරන්න පුලුවන් පරිසර විනාශය අවම කරගනිමින්.

**තරුණ සංගමය විදියට පරිසරය රැකගැනීම වෙනුවෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද? ඉදිරියේදී ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියමාර්ග මොනවාද?**

ඇත්තටම අපි සමාජවාදී තරුණ සංගමය විදියට පරිසර විනාශයට එරෙහිව විවිධ ක්‍රියාමාර්ග අරගෙන තියෙනවා. දැනුවත්කිරීමේ වැඩසටහන්, වැඩමුළු වගේම විරෝධතා දක්වා වෙච්ච ක්‍රියාමාර්ග අපි කරලා තියෙනවා. ඒ වගේම අපි පරිසරය පිරිසිදු කරන වැඩසටහන්, පැළ හිටවන වැඩසටහන් වගේ ඒවත් කරලා සහ කරමින් ඉන්නවා.

නමුත් අපිට මේ වෙද්දී විශාල කාර්යයක් පැවරිලා තියනවා වර්තමාන පාලනය විසින් වේගවත් කරල තියන පරිසර විනාශය නතරකිරීම වෙනුවෙන්. පැහැදිලියි මේ විනාශය ආණ්ඩුව ලේසියෙන් නතර කරන්නේ නෑ!. ඒ නිසා මේ අසමත් ධනවාදය පරාජය කරන කාර්යය සමඟ සම්බන්ධ සටනක් බවට පරිසරය රැකගැනීමේ සටන පත්වෙලා තියනවා. ඉතින් අපි ඒ වෙනුවෙන් 2021 අවුරුද්ද පටන්ගන්න බලාපොරොත්තු වෙනවා, පරිසර විනාශය නවත්තන්න ආණ්ඩුවට බලකරන්න වගේම ජනතාවට මේ විනාශයට එරෙහිවෙන්න කියන පණිවිඩය දෙන දැනුවත් කිරීමේ පෝස්ටර් ව්‍යාපාරයක් රටපුරා දියත් කරමින්.

**මාක්ස්වාදී ව්‍යාපාරයක තරුණ නියෝජිතයන් ලෙස පරිසරය පිළිබඳ ඔබලාගේ විග්‍රහය මොන වගේද?**

මාක්ස්වාදී ව්‍යාපාරයක තරුණයෝ විදියට අපි පරිසරය දිහා දකින විදිහක් තියනවා. අපි දන්නවා සියලු ජීවයේ උපත, ගර්භාෂය මේ සොබාදහම කියලා. ඇත්තටම මිනිසා කියන්නෙම සොබාදහම කියන ගර්භාෂයේ නිර්මාණයක්. මිනිසා අනිකුත් ජීවීන්ගෙන් වෙනස්වෙන්නේ මිනිසාට චින්තන හැකියාව ලැබිල තියන නිසා. ඒක ලැබුනෙත් සොබාදහම විසින්. නමුත් මිනිසා ඒ චින්තන හැකියාවම පාවිච්චි කරනවා සොබාදහම තමාට අවැසි ලෙස පාලනය කරන්න. මාක්ස්වාදීන් විදිහට අපි හිතනවා සොබාදහම එක්ක එහෙම ගමනක් යන්න බෑ කියලා. සොබාදහම එක්ක තියෙන්නෙ සාමූහික ගමනක්! සොබාදහමේ පාලකයෙක් බවට මිනිසා පත් නොවී සේවකයෙක් බවට පත් වුණොත්, අන්න අපිට සොබාදහම සමඟ සාමූහික ගමන් යන්න පුලුවන් වෙයි. නැතිනම් මේ පෘථිවි ගෝලයේ විනාශය වේගවත් වෙයි.

ඒ නිසා අපි මේ රටේ තරුණ තරුණියන්ට ආරාධනා කරනවා සොබාදහම විනාශකරමින්, ධනය ගොඩගහන විනාශකාරී ධනවාදය වෙනුවට සොබාදහම සමඟ සාමූහික ගමනක් යා හැකි නවමු සමාජවාදී සමාජයක් ගොඩනගන සටන සමඟ අත්වැල් බැඳගන්න කියලා.

The Gadget

## Modmount Smartphone Mounting Redefined
# නැතිවම බැරි ෆෝන් එක ළඟින්ම තියාගන්න



මොඩ්මවුන්ට් යනු ලොව ප්‍රථම ආරක්ෂිතම ස්මාර්ට්ෆෝන් සවිකිරීමේ පද්ධතිය වන අතර මෙහි විශේෂත්වය වන්නේ සෑම මොහොතකම ස්මාර්ට්ෆෝනය ඔබගේ ක්‍රියාකාරී ජීවන රටාවකට ඒකාබද්ධ කිරීමයි. එමඟින් ඕනෑම දුරකථනයක් රැහැන් රහිතව ආරෝපණය කිරීමට ඔබට ඉඩ සලසයි.

## Looking Glass Portrait
# පණ තියෙන රූප



පුළුල් පරාසයක ත්‍රිමාණ අන්තර්ගතයන් නිර්මාණය කිරීම පහසු කරන මෘදුකාංගයකින් සමන්විතය. සජීවීකරණ ත්‍රිමාණ අක්ෂරවල සිට පවුලේ පින්තූර දක්වා සියල්ල නිර්මාණය කිරීමට පරිශීලකයින්ට ඉඩදෙයි. ඔබට අවශ්‍ය වන්නේ ආරම්භ කිරීම සඳහා පෝට්රේට් මාදිලියේ ඡායාරූප ගැනීමට හැකි නව අයිෆෝන් වැනි පරිගණකයක් සහ දුරකථනයක් පමණි.

## OpenSeed
# අපූරු භාවනාව



OpenSeed නිර්මාණය කර ඇත්තේ සේවා ස්ථානයේ සහ වෙනත් තදබදය සහිත ස්ථානවල සන්සුන් බවක් ලබාදීම සඳහාය. ශබ්දය, මඟ පෙන්වන භාවනා, ආලෝකකරණය සහ තාක්ෂණය ඒකාබද්ධ කිරීමේ හා තවත් තාක්ෂණික නිර්මාණශීලිත්වය භාවිතා කරමින් ඔබගේ මානසික ආතතියට බිහි වූ අපූරු නිර්මාණයකි. මෑත අධ්‍යයනයකින් හෙළි වී ඇත්තේ OpenSeed භාවිතා කිරීමේදී භාවනාවේ effectiveness සැලකිය යුතු ලෙස වැඩි කරන අතර එහි ප්‍රතිලාභ වැඩි කරන බවයි.

## The Innovative Three-In-One Portable Washer & Dryer
# අතේ ගෙනයන වොෂින් මැෂින් එක

බලශක්ති-කාර්යක්ෂම විකල්පයක් සොයන අයට, වෝටර් ස්පිටීර් විශිෂ්ට තේරීමකි. එහි සංයුක්ත ප්‍රමාණය හා කාර්යක්ෂම රෙදි සෝදන ක්‍රම නිසා සාමාන්‍ය රෙදි සෝදන යන්ත්‍රවලට වඩා අඩු ජල ප්‍රමාණයක් භාවිතා කරන අතර පරිසර හිතකාමී ලෙස දෛනික පරිභෝජනය අඩු කරයි.




නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් වෝටර් ස්පිටීර් සාමාන්‍ය අතේ ගෙන යා හැකි රෙදි සෝදන යන්ත්‍රවලට වඩා පස් ගුණයකින් බලවත්ය.

## Glouv Lite
# ආරක්ෂාකාරී වන්න



ග්ලූව් ලයිට් යූවී-සී තාක්ෂණය මඟින් ඔබේ මුහුණු ආවරණයේ ජීවත්වන බැක්ටීරියා සහ වෛරස්වල ඇති ඩී.එන්.ඒ. බිඳ දමයි. ඔබේ මුහුණු ආවරණය ගලවා ග්ලූව් ලයිට් උපකරණය තුළට දමන්න. ඉහළ කාර්යක්ෂමතාවයකින් යුත් 270nm පරාසයේ LED මඟින් එම කරදරකාරී විෂබීජ විනාශ කිරීමට උපකාරී වේ.

# ධනවාදයට හසු නොවූ වූ මානව පැවැත්ම

සාමූහික ජීවන පැවැත්මක් තිබූ මානවයාට යුගලමය පැවැත්මක් හෙවත් පවුල ඇතිවීමෙන් එක් පුරුෂයෙකු එක් ස්ත්‍රියක් සමඟ මෙන්ම එක් ස්ත්‍රියක් එක් පුරුෂයෙකු සමඟ වාසය කිරීම දක්වා වෙනස්වීම මානව ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය අධ්‍යනයෙන් තේරුම්ගත හැකිය. ධනවාදී මතය අනුව විවාහය එක්තරා නීතිමය ගිවිසුමකි. දෙදෙනෙකුගේ ශාරීරික හා බුද්ධිමය ඉරණම සඳහටම තමන්ට රිසි සේ තීරණය කිරීමට ඉඩ ලබාදීමකි. බාහිර වශයෙන් මෙය තම කැමැත්ත අනුව සිදුවන්නක් බව පෙනේ. එහෙත් මේ කැමැත්ත ලබාදෙන්නේ කෙසේද? කවුද?

ධනපති පංතිය විවාහයටත් නිදහස් ගිවිසුම් ක්‍රමය තිබිය යුතු යැයි තහවුරු කරමින් සිටිය නමුත් අන්‍යෝන්‍ය ලිංගික ආකර්ශනය පදනම් කරගනිමින්, පුරුෂයා සහ ස්ත්‍රිය අතර නිදහස් ගිවිසුමක් මත සිදු නොවන විවාහය අශික්ෂිත විවාහයක් ලෙස සලකන ලදී. ප්‍රේමය නිසා විවාහ වීම මිනිස් අයිතියක් ලෙස ප්‍රකාශ කළ නමුත් මුල්කාලීනව මෙය ධනපති පංතියට පමණක් හිමි වූ වරප්‍රසාදයක්ව පැවතිණ.

බැලූ බැල්මට වරප්‍රසාදයක් ලෙස පෙනී ගියද විවාහ ක්‍රමය හේතුවෙන් මානවයාට මුහුණදීමට සිදුවී ඇත්තේ අවුල් සහගත තත්වයකටයි. මන්ද සාමූහික අනන්‍යතාවයක් පැවති අප ශිෂ්ටාචාරගත සමාජයක සාමාජිකයෙකු ලෙස ජීවත්වීමට සිදුවීම ධනවාදී,



පාරිභෝජනවාදී සමාජ ව්‍යුහයක් තුළ නොවැලැක්විය හැකි ස්වයංක්‍රීය බලයට අවනත වීමකි. මෙහිදී ඔහු සතු සියලුම ආශාවන් වෙළෙඳපොළක්

14 පිටුවට

## දැනුම 03

### ජීවීන් බිහිවීම



# ඓතිහාසික කාලච්ඡේදය

දැනුම ලිපියේ පසුගිය කලාපයෙන් අප සාකච්ඡා කළේ පෘථිවිය බිහි වූ දා සිට මේ දක්වා ඉතිහාසය හැදෑරීමේදී ඉතිහාසඥයින් විසින් එය බෙදා ඇති ආකාරය පිළිබඳවයි. එම කාල පරිච්ඡේදයන් පිළිබඳ මෙම කලාපයෙන් හදාරමු.

භූ විද්‍යාඥයින් විසින් භූ ඉතිහාසය ප්‍රධාන කාලාන්තර දෙකකට බෙදා වෙන්කර ඇත. ඒවා නම්,

1. ප්‍රාග් කේම්බ්‍රියන් කාලාන්තරය හෙවත් ක්‍රිස්ටොසොයික කාලාන්තරයක්

2. කේම්බ්‍රියන් කාලාන්තරය හෙවත් ෆානෙරොසෙයික කාලාන්තරය

මෙම බෙදීම සඳහා ඔවුන් විසින් පදනම් කොට ගෙන ඇත්තේ පෘථිවි පෘෂ්ඨයේ එක් එක් ස්ථරවල විෂමතාවයන්ය. ප්‍රාග් කේම්බ්‍රියන් කාලාන්තරය අදින් වසර මිලියන 4500කට පෙර සිට මිලියන 544කට පෙර දක්වා පැවති වසර මිලියන 3956ක් වූ කාල පරිච්ඡේයක් වේ. ෆානෙරොසෙයික කාලාන්තර එතැන් සිට අද දක්වා වූ මිලියන 544ක් පුරා පැතිර ගොස් ඇත.

ගුගුරා හැලෙන මහා ගිනි ගුලියක් ලෙස බිහි වූ අප වසන පෘථිවිය මෙම දීර්ඝ කාලය තුළ දී සෞම්‍ය, මිත්‍රශීලී, ජීවයෙන් පිරි ග්‍රහලෝකයක් ලෙසට පරිණාමය වූ ආකාරය පිළිබඳ කතා පුවත ඇත්ත වශයෙන්ම විෂ්මය ජනකය.

භූ විද්‍යාඥයින් විසින් අධ්‍යනය කිරීමේ පහසුව මත මෙම කලාන්තර ප්‍රධාන අවධි වලට බෙදා වෙන්කොට ඇති ආකාරය පහත දැක්වේ.

**1. ප්‍රාග් කේම්බ්‍රියානු කාලාන්තරය** (වසර මිලියන 45000 කට පෙර සිට වසර මිලියන 544 කට පෙර දක්වා)

I. හාඩියන් අවධිය: 4500 - 3800

II. ආචියාන් අවධිය: 3800 - 2500

III. ප්‍රොටෙරොසොයික් අවධිය: 2500 - 544

වෙන්ඩියානු යුගය 650 - 544

**2. ෆානෙරොසොයික කාලාන්තරය**

(වසර මිලියන 550 කට පෙර සිට අද දක්වා )

*I.පැලියොසොයික අවධිය: 544 - 245*

කේම්බ්‍රිය යුගය: 544 - 505
ඕර්ඩොවිසිය: 505 - 440
සිලූරිය: 440 - 410
ඩෙවොනිය: 410 - 360
කාබොනිපෙරස: 360 - 286
පර්මියන: 286 - 245

*II.මෙසොසොයික අවධිය: 245 - 65*
ට්‍රයැසික යුගය: 245 - 208
ජුරාසික යුගය: 208 - 146
ක්‍රිටෙසිය යුගය: 146 - 65

*III. සෙනොසොයික අවධිය = 65 - අද දක්වා*

පැලියොසීන යුගය = 65 - 54
ඉයොසීන යුගය = 54 - 38
ඔලිගොසීන යුගය = 38 - 23
මයොසීන යුගය = 23 - 5
ප්ලයෝසීන යුගය = 5 - 1.8
ප්ලයිස්ටොසීන යුගය = 1.8, සිට වර්ෂ 11000 කට පෙර දක්වා
හොලොසින යුගය = වර්ෂ 11000කට පෙර සිට අද දක්වා

මෙම අවධි හා යුග ඔස්සේ ලෝකය පරිණාමය වූ ආකාරය මෙතැන් සිට සොයා බලමු.

# රැඩිකල් වෙමු!

එකෝමත් එක රටක විලක් තිබුණා. ඒ විලේ ගෙම්බෙක් සහ මාළුවෝ රංචුවක් හිටියා. දවසක් විලට වතුර බොන්න ආපු අලියෙක් දැක්ක මාළුවෝ ඒ ගැන පුදුමයෙන් කතා වුණා. ඉතිං මේ කතාව අහපු ගෙම්බා, මටත් පුළුවනි අලියෙක් වගේ ලොකුවෙන්න කියලා පිම්බෙන්න පටන් ගත්තා. ටිකක් පිම්බිලා මාලුවන්ගෙන් ඇහුවා දැන් මම අලියෙක් විතරද කියලා. උන් කිව්වා අලියා ඊට වඩා විශාලයිනේ කියලා. ඔහොම මාළුන්ට පේන්න පිම්බි පිම්බි ඉඳලා එකපාරටම ගෙම්බා පිපිරිලා ගියා.

මිනිස්සුන්ට ජීවිතේ ගෙනියද්දි අවශ්‍යතා සහ උවමනා කියලා දෙකක් ඇති වෙනවා. අවශ්‍යතා කියන්නේ එදිනෙදා ජීවිතය පවත්වා ගැනීමට අපට අවශ්‍ය වන දේවල්. ආහාර, ඇඳුම්-පැළඳුම්, ප්‍රවාහන පහසුකම් වගේ දේවල්. උවමනා කියන්නේ ඒ අවශ්‍යතා සපුරාගැනීම සඳහා මිනිස්සු භාවිතා කරන දේවල්. උදාහරණයක් විදියට ගත්තොත් ආහාර කියන අවශ්‍යතාවය සපුරගන්න උවමනා වෙන්නේ බත්, පාන් ආදිය. අවශ්‍යතා සරල සහ සීමිත වෙන අතර උවමනා සංකීර්ණ සහ අසීමිතයි.



තම තමන් අවශ්‍යතා සපුරාගැනීම සඳහා උවමනා දේ තෝරාගත යුත්තේ තමන්ගේ ආර්ථික, සාමාජීය, සංස්කෘතික තත්වය අනුව. නමුත් වෙළඳපොල විසින් තම ලාභ උපරිම කිරීමේ පරමාර්ථයෙන් ඔවුන්ගේ නිෂ්පාදන මිලදීගැනීම සඳහා අපව පොළඹවනවා. වර්තමානයේ සමාගම් නිෂ්පාදන කරන්නේ වෙළඳපොළ අවශ්‍යතාවයට නෙවෙයි. ඔවුන් නිෂ්පාදන හඳුන්වා දී මිලදීගැනීම සඳහා අපව පොළඹවනවා. ගෙඹි අපි ඉස්සරහා අලි ප්‍රතිරූප හදලා අපිට පිම්බෙන්න බල කරනවා. තේරුම් නොගෙන පිම්බෙන්න ගියොත් නිකරුණේ පිපිරෙන්නයි අපිට වෙන්නේ.

# කවි නිම්නය

**ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්**
ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න.
අප සූදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්
FORWARD කවි පිටුවේ වෙන් කරන්න.

මෙන්න අපගේ ලිපිනය

FORWARD කවි පිටුව,
අංක464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
syuforwardnews@gmail.com

## මස්කෙළිය

පට්ටියේ මහ හරක්
පැටවුනුත් සමහරක්
හදාගෙන පෝළිමක්
රටම දැං එකම මස්කෙළියක්!...

සමහරු තොගේට මස්
සමහරු ඉබේට මස්
පිරවෙද්දි සමහර කුස්
හුඟදෙනෙක් ගොං ගස්!...

කිරි මොටද, පැණි තියේ වලඳන්ට...
කහ මොටද, කහනවා නිල් වෙන්ට...
නඩු මොටද, උසාවිය ගිණිලන්ට...
හිස් මොටද, පණ පිටින් වැළලෙන්ට!!...

**] සම්පත් මිහිරගේ - හම්බන්තොට [**

## ඔන්ලයින්ම කෙළවෙන අපූරුව

තිහක් වයසයි, පුතා දක්ෂයි
තාත්තා කිරි කපනවා
තාම පවුලක් රකිනවා

උපාධිය දා දීපු බම්බුව
ගුල්ලො ගහ ගහ දිරනවා
අම්මා ඉඹ ඉඹ පිහිනවා

රජයෙ රැකියාවලට ඉන්ටර්ව්
ලිස්ටෙකේ නම හොයනවා
"දැනුම් දෙන්නම්" කියනවා

සිරා කොක්කට නිතර ගෙදරින්
අලුත් මඟුලක් බලනවා
"පැනලාවත් යමු" අහනවා

අහසෙ දෙවිවරු ඇරියස්ලු බිල්
එහේ වයිෆයි කපනවා
කන්නලව් මඟ හැරෙනවා

ග්‍රහයො නම් ඔන්ලයින් නිතරම
මේල් එහෙමත් එවනවා
"දිගට කෙළවමි" කියනවා

] N.D. **නදීර** [

## යුද්ධය

විකුණ විකුණම මරන් කන
සිල්ලරට පටන්ගෙන
තොග මිලට අවසන්ව
ආයේ ආයේම නිවී ඇවිලෙන
රේඛාවකට මෙහායින් නැවති
උණ්ඩ විතරයි බැණුම් ඇහුවෙම
ඒ උනත්,
යුද්ධයේ
ලේ සුවඳ හේතුවක්!,
කාගෙහරි හිනාවට..

**] ප්‍රශාන් කහගල්ල - කෑගල්ල [**

## උල්කාපාත වැහි

අපේක්ෂාම විතරක් ඇති පුරයක
වරමක් ඉල්ලන්න...
තරුවක් කඩන් වැටෙන තුරු
වරුවක් බලන් ඉන්න වැසියන්!

**] යශෝධා සමරධීර [**

## ගේම් ගහන ජීවිත...

ගරා වැටුනු මාවත්වල
කියා දුන්නු පාඩම් ඇත...
නෙලාගත්ත මල්වලටත්
වැහි වැටුනේ පෙති හලාන...
දරාගත්ත හැම මොහොතෙම
හිත හිටියේ හිත හදාන...
රූකඩ ළඟ හෙවණැලිවල
අපි හොයනව අපේ හීන...

මල් එක දෙක පිපුණු කලට
හිනා උනේ හීන එක්ක...
බර වැඩිවෙන විට මල්වල
කඳුලු කතා කළේ එමට...
නිදිවරනා පරඬැලි ළඟ
කතා කළත් සඳෙන් සඳට
මුවාවෙලා හිනාවුණා
game ගහන් life වලට...

**] තරිඳු මදුභාෂණ - කැකිරාව [**



## අවසරට, අමතකයි බුදු බණ

ඩිපෙන්ඩර කාගෙන මහපාර
උස් අසුනට හිර කරගෙන සිවුර
තප්පරෙන් ඉගිලෙන මහ දුර
බලන් හිටියා උහුලගෙන බර
තෙරක් නොපෙනෙන සසර...

දුකයි සසරම රකින කල පණ
හදයි බැමි නෙක මාලිග වෙන
නැසෙද්දී බවුන් වඩනා මහ වන
රැකිය යුතු පෙරුම්දම් අළුවෙන
අවසරට, අමතකයි බුදු බණ...

**] බුද්ධික සම්පත් - අනුරාධපුර [**

# ගොවි සටන හමුවේ ඉන්දියානු රජය දණගසනු ඇත

වර්තමානයේ ලොව පුරා කතාබහට ලක් වී තිබෙන ඉන්දියානු ගොවීන්ගේ සටන ප්‍රබල ජනතා සටනකි. ඉන්දියාව තුළ වර්තමානයේ මතුව තිබෙන ගොවි ගැටලුවට හා ගොවීන්ගේ අරගලයට හේතු වී තිබෙන්නේ පසුගිය සැප්තැම්බර් මාසයේ දී අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි ප්‍රමුඛ අන්ත දක්ෂිණාංශික භාරතීය ජනතා පක්ෂ ආණ්ඩුව විසින් නව ගොවිපළ නීති තුනක් ගෙන ඒමයි. පසුගිය සැප්තැම්බර් 17 වැනිදා ඉන්දියානු පාර්ලිමේන්තුව වන 'ලෝක් සභාව' තුළත්, සැප්තැම්බර් 20 වැනිදා රාජ්‍ය සභාව තුළත් සම්මත කරන ලද මෙම පනත් තුන සැප්තැම්බර් 27 වැනිදා ඉන්දියානු ජනාධිපති රාම් නාත් කෝවින්ද්ගේ අත්සන යෙදීමෙන් පසු බලාත්මක කරන ලදී.

මෙම කෘෂිකාර්මික නීති වනුයේ,

1.ගොවි නිෂ්පාදන වෙළෙඳ හා වාණිජ්‍යය (ප්‍රවර්ධන හා පහසුකම් සැපයීමේ) පනත.

2.ගොවීන් සවිබල ගැන්වීම හා ආරක්ෂා කිරීම (මිල සහතික කිරීම හා ගොවි සේවා පනත).

3.අත්‍යවශ්‍ය භාණ්ඩ (සංශෝධන) පනත.



මෙම නව නීති සම්බන්ධයෙන් ඉන්දියානු අගමැති නරේන්ද්‍ර මෝදි පවසන්නේ, මෙමඟින් දැවැන්ත ඉන්දියානු කෘෂිකර්මාන්තය නියාමනයට හා විප්ලවීය වෙනසකට, දියුණුවකට ලක් වන බවයි. එමෙන් ම ගොවීන් අතරමැදියන්ගේ කුරිරුකම්වලින් මුදා ගැනෙන බවයි. මෙම නව නීතිවලට අනුව ගොවීන්ට තම නිෂ්පාදනය රජය නියාමනය කරන වෙළෙඳපොළවල් (මැන්ඩිෂ්) මඟහැර අතරමැදියන් නොමැතිව ගැනුම්කරුවන් වෙත සෘජුව ම අලෙවි කිරීමට යෝජනා කර තිබේ. නමුත්, ගොවීන් පවසන්නේ, තමන් විශාල සමාගම්වලට බිය වන බවයි.

විශේෂයෙන් නව නීති මඟින් ඔවුන්ට තිබුණු බොහෝ ආරක්ෂණ ඉවත් කර තිබේ. ඉන්දියාවේ වගා කරන ගොවි බිම්වලින් සියයට 86ක් පමණ තිබෙන්නේ, අක්කර පහට අඩු ඉඩම් ප්‍රමාණයක් හිමි කුඩා වතුහිමියන් සතුවයි. එවැනි තත්ත්වයක් තුළ තම නිෂ්පාදන විශාල සමාගම්වලට විකිණීමට කටයුතු කරන විට නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබා ගැනීමට කේවල් කිරීමේ බලයක් තමන්ට නොමැති නිසා ඔවුහු බිය වෙති. ඔවුන් රජයට චෝදනා කරන්නේ, රජය ඔවුන් මහා සංගතවල දයාව පෙන්වා අත්හැර ඇති බවයි.

එමෙන් ම මහා පරිමාණ ගැනුම්කරුවන් සමඟ නිෂ්පාදනයට පෙර කොන්ත්‍රාත් ගිවිසුම්වලට ගොවීන්ට එළැඹිය හැකි ය. නමුත්, ගිවිසුම් තුළ ඔවුන්ට නීතිමය ආරක්ෂාව ලැබේ දැයි යන්න සැකසහිත ය. මක් නිසාද යත්, නව නීති මඟින් ලිඛිත ගිවිසුම් අනිවාර්යය නොවේ. එබැවින්, කිසියම් කොන්දේසි උල්ලංඝනය කිරීමක දී තමා අගතියට පත් වී ඇති බව ඔප්පු කිරීම ගොවියකුට ඉතා අසීරු විය හැකි ය. එම ආරවුල් විසඳීම සඳහා ඊනියා සම්මුති මණ්ඩලයක්, දිස්ත්‍රික් පරිපාලන නිලධාරීන් හා අභියාචන අධිකරණයක් යෝජනා කර ඇතත්, තමන්ට වන අසාධාරණවලට එරෙහිව ගොවීන්ට සාමාන්‍ය උසාවියකට යා නොහැකි ය.

ඊට අමතරව නව නීති මඟින් කිසිදු නිෂ්පාදනයක් සඳහා අවම මිලක් සහතික නොකරන අතර, ගොවීන් කනස්සල්ලට පත් වන්නේ පවතින අවම මිල සහතික කිරීම් ද (Minimum Price for Product - MPS) ඉදිරියේ දී යම් අවස්ථාවක දී අහෝසි වී යනු ඇතැයි යන බිය ය. මීට පෙර යම් භාණ්ඩ ප්‍රමාණයකට හෝ අවම සහතික මිලක් ආණ්ඩුව පවත්වා ගැනීම නිසා කිසියම් ආරක්ෂණයක් ගොවීන්ට තිබුණු බව ඔවුහු පවසති.

මෙම නව නීති මඟින් ගොවීන් පමණක් නොව විවිධ ක්ෂේත්‍රවලට ද බලපෑම් සිදු වේ. විශේෂයෙන් ම ගොවීන්ගේ නිෂ්පාදන විද්‍යුත් වෙළෙඳාමට සහ ඊ වාණිජ්‍යයට ඉඩ සැලැසීම යෝජනා කර තිබෙන බැවින්, වෙළෙඳාමේ දී වෙළෙඳුන්ට සහ ඉලෙක්ට්‍රොනික වෙළෙඳ වේදිකාවලට වෙළෙඳපොළ ගාස්තුවක් හෝ සෙස් හෝ වෙනත් බදු අය කිරීමේ බලය ප්‍රාන්ත ආණ්ඩුවෙන් ඉවත් කර තිබේ. එම නිසා ප්‍රාන්ත ආණ්ඩුවල ආදායම් ලැබීම්වලට ද එය බලපා තිබේ. සමස්තයක් ලෙස ගත් විට ගොවීන් බිය වන්නේ, තමන්ට නව රෙගුලාසි මඟින් ලබා ගත ප්‍රතිලාභ ප්‍රමාණයට වඩා අහිමි වීම් වැඩි වනු ඇතැයි කියා ය. මෙම ක්‍රමයේ ප්‍රධාන ප්‍රතිලාභීන් වනුයේ, දැවැන්ත මූල්‍ය බලය සහිත කෘෂිකාර්මික සමාගම් බව ඔවුහු විශ්වාස කරති.

කරුණු එසේ පවතිද්දී, මේ නීති බලාත්මක කරන ලද පසුගිය සැප්තැම්බර් මාසයේ සිට කුඩා පරිමාණයෙන් පටන්ගෙන මුළු ඉන්දියාවට ම බලපෑම් වන දැවැන්ත විරෝධතාවක් මට්ටමට වර්තමානය වන විට ඉන්දියානු ගොවි අරගලය පත්ව තිබේ. එය ඉන්දියාවේ පමණක් නොව ලෝකය ම කතා කරන සම්ප්‍රදායයෙන් බැහැර වූ දේශපාලනිකව ආශ්වාදජනක සටනක් වී තිබේ. සැප්තැම්බර් 24 වැනිදා පන්ජාබ් ප්‍රාන්තයේ දුම්රිය ධාවනයට බාධා ඇති කරමින්, ගොවීහු විරෝධතා දැක්වූහ. ඔවුන් එය නම් කර තිබුණේ, (Rail Roko) යනුවෙනි. ආරම්භයේ දී පන්ජාබ් සහ හර්යානා සහ රාජස්තාන් වැනි ප්‍රාන්ත කිහිපයක පැවැති උද්ඝෝෂණ ක්‍රියාමාර්ගවලට ආණ්ඩුව යහපත් ප්‍රතිචාර නොදැක්වීම නිසා ඊ ළඟ පියවර ලෙස 'දිල්ලි යමු !' (Dilli Chalo) ලෙසින් ඉන්දියාවේ අග නගරයට ගමන් කිරීමේ උද්ඝෝෂණ ක්‍රියාමාර්ගයට ඔවුහු අවතීර්ණ වූහ. භාරතීය ජනතා පක්ෂය බලය හොබවන හර්යානා ප්‍රාන්ත රජය මධ්‍යම රජය හා එක් ව මෙම ගමන නැවැත්වීමට හර්යානා ප්‍රාන්ත සීමාවේ දී සියලු බර යෙදී ය. කඳුළු ගෑස් ප්‍රහාර, ජල ප්‍රහාර, බැටන් ප්‍රහාර හා කොන්ක්‍රීට් බාධක යෙදීම වැනි දෑ සිදු කළ ද, එය අසාර්ථක විය.

නොවැම්බර් 26 වැනිදා සිදු කළ එක්දින වැඩ වර්ජනය සඳහා ඉන්දියාව පුරා මිලියන 250ක ජනතාවක් සම්බන්ධ වී සිටියහ. එහි දී නව නීතිවලට මෙන් ම කම්කරු නීති වෙනස් කිරීමේ යෝජනාවලට එරෙහිව ද විරෝධතාව දක්වන ලදී. නොවැම්බර් 28 සිට දෙසැම්බර් 03 දක්වා දිනවල දී දළ ඇස්තමේන්තුවලට අනුව ගොවීන් ද ඇතුළුව ලක්ෂ දෙකත්, තුනත් අතර පිරිසක් දිල්ලිය අවහිර කිරීමේ ක්‍රියාමාර්ගය සඳහා වූ ගමනට එක් වී සිටියහ.

මෙම සටනේ සුවිශේෂීත්වය වනුයේ, ගොවීන්ට අමතරව කම්කරු සංගම්, ට්‍රක්රථ රියැදුරන්, තරුණයන්, ශිෂ්‍යයන් මෙන් ම දේශපාලන පක්ෂ සහ සංවිධාන ද මෙම සටනට සම්පූර්ණ සහයෝගය දැක්වීමයි. ප්‍රාන්තවලට කෙරෙන සැපයුම් අත්හිටුවූ මිලියන 14ක් ට්‍රක්රථ රියැදුරෝ ගොවි සටනට තම සහයෝගය පළ කළහ. දෙසැම්බර් 4 වැනිදා ගොවි සංගම් සහ ආණ්ඩුව කෙරුණු සාකච්ඡා අසාර්ථක වීමෙන් පසුව දෙසැම්බර් 08 වැනිදා ගොවි සංගම් විසින් සමස්ත මහා වැඩ වර්ජනයක් ප්‍රකාශ කරන ලදී. එය හැඳින්වූයේ Bharat Bandh යනුවෙනි. All India Kisan Sangharsh Coordination Committee (AIKSCC) මෙහෙයැවීමෙන් පැවැති මෙම රට වැසීමේ ක්‍රියාමාර්ගයට ගොවි සංවිධාන 500කට වැඩි ප්‍රමාණයක් සම්බන්ධ විය. රට පුරා ප්‍රාන්ත 22ක ස්ථාන 22,000ක පමණ උද්ඝෝෂණ සංවිධානය විය. ඒ සඳහා විවිධ ජන කොටස් ඔවුන්ගේ සහයෝගය පළ කළහ. තව තවත් ක්‍රියාමාර්ග තෝරමින් ඉතා දැවැන්ත ජනතා උද්ඝෝෂණ ව්‍යාපාරයක් ඔවුහු දියත් කළහ. ආණ්ඩුවේ හිතවත් ව්‍යාපාරිකයන්ගේ මුකේෂ් අම්බානිගේ 'රිලයන්ස්' සහ අදානිගේ භාණ්ඩ හා සේවා වර්ජනය කිරීමට ද උද්ඝෝෂකයන් විසින් ඉල්ලීම් කර තිබිණි. එමෙන් ම ඉන්දියානු හමුදාවේ සේවය කොට විශ්‍රාම ගොස් සිටින හමුදා නිලධාරීහු තම තමන්ගේ පදක්කම් ආණ්ඩුවට භාර දීමේ ක්‍රියාමාර්ග ගනිමින් සිටිති. මන්ද, ඔවුන් බොහෝ දෙනා ගොවි පවුල්වලට සම්බන්ධ අය විමයි.

ඉන්දියාවෙන් පිට සිටින ඉන්දියානුවෝ (ඉන්දියානු ඩයස්පෝරා) ලොව බොහෝ රටවල සිට ගොවීන්ගේ විරෝධතා ව්‍යාපාරවලට සහාය දක්වන ක්‍රියාමාර්ග ගනිමින් සිටිති. මෙම සියලු කරුණු සැලැකීමේ දී ඉන්දියානු ගොවි සටනේ ප්‍රබලත්වය අපට පමණක් නොව දැන් දැන් ඉන්දියානු ආණ්ඩුවට ද දැනෙමින් තිබේ.

කොරෝනා අර්බුදය හමුවේ ජනතාව තම ජීවිත රැකගැනීමේ සටනක යෙදෙමින් සිටිද්දී, ඔවුන්ගේ අවධානය වෙනතක යොමුව තිබිය දී, මෙම ගොවි පනත් තුන සම්මත කර ගැනීමට ඉන්දියානු රජය උත්සාහ කළ ද, එය අසාර්ථක වී තිබේ. මෙම විරෝධතා අවතක්සේරු කළ ආණ්ඩුව මාධ්‍ය මෙහෙයවමින් මෙය අන්තවාදීන්ගේ හා ත්‍රස්තවාදීන්ගේ බෙදුම්වාදී ක්‍රියාමාර්ගයක් ලෙස හුවාදැක්වීමට ගත් උත්සාහය ද පරාජයට පත් වී තිබේ.

ගොවීන් පවසන්නේ, මෙම පනත් ඉවත් කර ගන්නා තුරු අඛණ්ඩව විරෝධතා සිදු කරන බවයි. වෙනත් කිසිදු සංශෝධනයකට ඔවුහු එකඟ නොවෙති. ඉන්දියානු ගොවි සටන හමුවේ අවසානයේ රජයට අනිවාර්යයෙන් ම දණගසන්නට සිදු වනු ඇත.

ඉන්දියානු ගොවි ජනතාවගේ අරගලය අපට ද ධෛර්යය සපයන සටනකි. එමෙන් ම මෙම අරගලය තුළ සටන් කරමින් සිටින ගොවි ජනතාවට, වෘත්තීය සමිතිවලට, ගොවි සංගම්වලට, වමේ ව්‍යාපාරයට, ප්‍රගතිශීලී බලවේගවලට, තරුණ හා ශිෂ්‍ය ප්‍රජාවට අපි ශක්තිය, ධෛර්යය ප්‍රාර්ථනා කරන්නෙමු.

# ජෝ බයිඩන්ගේ ධවල මන්දිර සන්නිවේදන කණ්ඩායමට කාන්තාවන් පමණයිලු!




ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා ලෙස තේරී පත්ව සිටින ජෝ බයිඩන් ධවල මන්දිරයේ සන්නිවේදන කටයුතු සඳහා කාන්තාවන් පමණක් සිටින කණ්ඩායමක් තෝරා පත්කරගෙන ඇත. ඒ අනුව විවිධ වර්ණයෙන් යුත් කාන්තාවන් මේ තනතුරු සඳහා පත් කරගෙන ඇත. මේ අතර බයිඩන්ගේ කළමනාකාර සහ අයවැය කාර්යාලයේ ප්‍රධාන ධූරය සඳහා ඉන්දියානු-ඇමරිකානු සම්භවයක් සහිත නීරා ටන්ඩන් නම්කර ඇතැයි වාර්තා වේ. ඇය ඩිමොක්‍රටික් පක්ෂයේ ප්‍රතිපත්ති සම්පාදන කාර්යාලයේ සාමාජිකාවක්ද වේ. ඇය මෙම ධූරය වෙත පත්වුවහොත් ධවල මන්දිරයේ මෙම ධූරය සඳහා එතෙක් මෙතෙක් පත් වුන සුදු ජාතික නොවන පළමු කාන්තාව බවට පත් වේ.

# නවසීලන්ත රජය 2025දී කාබන් විමෝචනයෙන් තොර වෙනවාලු!



2025දී නවසීලන්ත රජය කාබන් විමෝචනයෙන් තොර වන බව එරට අගමැතිනි ජසින්ඩා ආර්ඩෙන් පවසා තිබේ. 2030 වන විට ගෝලීය උෂ්ණත්වය සෙල්සියස් අංශක 1.5කින් අඩුකිරීම සඳහා කටයුතු කරන බව ඇය වැඩිදුරටත් පවසා සිටියි. දේශගුණික විපර්යාස සොයාගැනීමේ අන්තර් රාජ්‍ය කමිටුව මගින් නිකුත් කර ඇති තොරතුරු පදනම් කරගනිමින් හදිසි තත්වයක් ප්‍රකාශ කර ඇත. මේ වන විට නවසීලන්තයට අමතරව ජපානය, කැනඩාව, ප්‍රංශය, බ්‍රිතාන්‍යය ඇතුළු රටවල් 32ක් මෙලෙස දේශගුණික හදිසි තත්වයක් ප්‍රකාශයට පත්කර ඇත.

# රුසියාව හා ජපානය අතර දූපත්වලට මිසයිල පද්ධතියක්



රුසියාව හා ජපානය ආසන්නයේ ඇති මතභේදකාරී දූපත් 04කින් යුත් දාමයකට නවතම S-300V4 මිසයිල පද්ධතියක් ඉදිකිරීමට රුසියානු රජය පියවර ගෙන ඇත. මෙහිදී බැලස්ටික් සහ ගුවන් ප්‍රහාර වෙත ප්‍රතිචාර දැක්විය හැකි ජංගම ගුවන් ආරක්ෂක පද්ධතියක් එම දූපත්වල පිහිටුවන බව එරට ආරක්ෂක අමාත්‍යාංශය වැඩිදුරටත් සඳහන් කර ඇත. දකුණු දිග කුරියිල්ස් ලෙස නම් වූ මෙම දූපත් සමූහය දෙවන ලෝක යුද්ධය සමඟ සෝවියට් සමූහාණ්ඩුව යටතට පත් වූවත් ජපානයද මේ සඳහා අයිතිවාසිකම් කියයි. දෙරට අතර වසර ගණනාවක් පුරා මේ සඳහා මතභේද පවතී.

# චන්ද්‍රයාගේ පාෂාණ සම්පල රැගෙන ඒම සාර්ථකයි!.



චන්ද්‍රයාගෙන් ලබාගත් පාෂාණ සාම්පල රැගෙන ඒමේ යානය සාර්ථකව පෘථිවියට ළඟා වූ බව ජාතික අභ්‍යවකාශ මධ්‍යස්ථානය සඳහන් කරයි. changZe 5 ලෙස නම් කර ඇති මෙම යානය වායුගෝලයේදී දෙවතාවක් පොළාපැනීමකට ලක්ව ඇති අතර පෘථිවියේ ගුරුත්වාකර්ෂණ බලයට හසුව, පසුව පෘථිවියට පැමිණීම ඇරඹී ඇත. පෘථිවියේ මතුපිට කිලෝමීටර් 10ක පමණ උසකදී පැරෂුට විවෘත කර ඇති අතර ඒ අනුව පෙර සැලසුම් කළ ආකාරයට යානය නිරූපද්‍රිතව ගොඩ බැස ඇත.



## ආගම බිහිවීම-03 කොටස

**පසුගිය කලාපය තුළින් අප ඔබ වෙතට යුදෙව් ආගම බිහිවීම සහ විකාශනය පිළිබඳ හඳුන්වා දෙන ලදී. යුදෙව් ආගම බිහිවීමේදී සමාජයට දායාද ලෙස ලැබුණ දෙය අතර පුරුෂයන් අතර චර්මඡේදනය හැඳින්විය හැකි අතර එය ලෝක ඉතිහාසය තුළ චර්මඡේදනය වාර්තාවන මුල් අවස්ථාව ලෙස ගැණිය හැක. ඒ වගේම ඒ වන විට යුදෙව් ජාතිකයන් හට නොයෙක් ජන කොටස්වලින් එල්ල වූ තර්ජනය විශේෂයෙන්ම පාරාවෝ, ඇසිරියන්වරු, චාල්ඩියන් රජු වෙතින් එල්ල වූ ආක්‍රමණවලින් යුදෙව් ජාතිකයන් ආරක්ෂා කරගැනීම සඳහා යුදෙව් ආගම විසින් යුදෙව් ජාතිකයන් අතර සමගිය වර්ධනය කරගැනීමට යුදෙව් ආගම යුදෙව් ජාතිකයන් පමණක් ඇදහිය යුතු යන ප්‍රකාශ කිරීම තුළින් වෙනත් ජාතියකින් එයට එල්ලවෙන තර්ජන වළක්වා ආරක්ෂිත උපක්‍රමයක් ලෙස භාවිතා කරන ලදී. ඒ වගේම යුදෙව් ජාතිකයන්ට වෙනත් ආගම් ඇදහීම හා වෙනත් දෙවියන් ගැන විශ්වාස කිරීමද තහනම් කරන ලදී.**

# බුද්ධාගම බිහිවීම

### බුද්ධාගම බිහිවීම හා ඒ වන විට ඉන්දියාවේ පැවති සමාජ-ආර්ථික වටපිටාව

පසුගිය කලාපය තුළින් අප ඔබ වෙතට යුදෙව් ආගම බිහිවීම සහ විකාශනය පිළිබඳ හඳුන්වා දෙන ලදී. යුදෙව් ආගම බිහිවීමේදී සමාජයට දායාද ලෙස ලැබුණ දෙය අතර පුරුෂයන් අතර චර්මඡේදනය හැඳින්විය හැකි අතර එය ලෝක ඉතිහාසය තුළ චර්මඡේදනය වාර්තාවන මුල් අවස්ථාව ලෙස ගැණිය හැක. ඒ වගේම ඒ වන විට යුදෙව් ජාතිකයන් හට නොයෙක් ජන කොටස්වලින් එල්ල වූ තර්ජනය විශේෂයෙන්ම පාරාවෝ, ඇසිරියන්වරු, චාල්ඩියන් රජු වෙතින් එල්ල වූ ආක්‍රමණවලින් යුදෙව් ජාතිකයන් ආරක්ෂා කරගැනීම සඳහා යුදෙව් ආගම විසින් යුදෙව් ජාතිකයන් අතර සමගිය වර්ධනය කරගැනීමට යුදෙව් ආගම යුදෙව් ජාතිකයන් පමණක් ඇදහිය යුතු යන ප්‍රකාශ කිරීම තුළින් වෙනත් ජාතියකින් එයට එල්ලවෙන තර්ජන වළක්වා ආරක්ෂිත උපක්‍රමයක් ලෙස භාවිතා කරන ලදී. ඒ වගේම යුදෙව් ජාතිකයන්ට වෙනත් ආගම් ඇදහීම හා වෙනත් දෙවියන් ගැන විශ්වාස කිරීමද තහනම් කරන ලදී.

ක්‍රිස්තු පූර්ව හයසියය පමණ වන විට ඉන්දියානු සමාජය තුළ පන්ති සමාජය බිහිවී රජය බිහිවී තිබූ පරිසරයක් විය. එදා ඉන්දියාව නූතන ඉන්දියාවට වඩා විශාල ප්‍රදේශයකි. නූතන පාකිස්තානය, බංගලිදේශය, නේපාලය භූතානය හා ඇෆ්ගනිස්තානයේ සමහර ප්‍රදේශ පවා එකල මහා භාරතය නම් වූ ඉන්දියානු පන්ති සමාජය සහිත රජයට අයත් වූවකි. මෙම සමස්ත ඉන්දියාවම රාජ්‍යයන් සහ ප්‍රාදේශීය රාජ්‍යයන්වලින් පාලනය වුවත් ඉන්දියානු පන්ති සමාජය තුළ බ්‍රාහ්මණ ආගම වෙතින් එල්ල වූ පීඩනය පාලනය කිරීමට රජය අපොහොසත් විය. මේ වන විට ඉන්දියාව බ්‍රාහ්මණ ආගමේ අනසකට ලක් වී තිබූ අතර බ්‍රාහ්මණ ආගමේ බ්‍රහ්ම මැවුම්වාදය විසින් සමස්ත ඉන්දියාවම ගිල ගෙන තිබූ යුගයකි. මැවුම්වාදය අනුව යාග-හෝම, බිලි පූජා නිරන්තරයෙන්ම සිදු විය. එම නිසා රටේ නිෂ්පාදනය විනාශ වූ අතර රට ආර්ථිකමය කඩාවැටීමකට ලක්විය.


ඒ වන විට ඉන්දියාව පැවතියේ කෘෂිකාර්මික රටක් ලෙසය. කෘෂිකාර්මික රටක පැවතිය යුතු ගව සම්පත බිලි පූජාවට ලක්වීමත්, අශ්වයන්න ගිනිබත් කරවීමත් බ්‍රහ්ම මැවුම්වාදය විසින් නිරන්තරයෙන්ම කරන ලදී. බ්‍රහ්ම මැවුම්වාදය විසින් මිනිසුන් කොටස් හතරකට වෙන්කොට පාලනය කළ අතර ඉන් ඉහළම කොටස බ්‍රාහ්මණයන් වූ අතර දෙවන තැන රාජ්‍ය පාලනය කරන පාලකයන්ද තෙවන තැන වෙළඳාම් කරන පුද්ගලයන්ද සිව්වන තැන ඉතාමත් පීඩාවට පත්වූ කම්කරු ශ්‍රමය වගුරුවන පීඩිතයන්ද විය. මෙම බ්‍රහ්ම මැවුම්වාදය විසින් මෙම පීඩිතයන් තවත් පීඩාවෙන් පීඩාවට පත්කරන ලදී. ඔවුන් සතුව යම් වස්තුවක් වූයේ නම් එයද බිලි පූජා හෝ ගිනිබත් කිරීමට ලක්විය. මෙය රටේ පාලකයන්ටද මහත් හිසරදයක් වූ ප්‍රශ්නයක් විය. බ්‍රහ්ම මැවුම්වාදයට එරෙහි නව ආගමික දර්ශනයක අවශ්‍යතාවය ඉන්දියානු පන්ති සමාජයට දැඩිව දැනෙන්න විය. එහි ප්‍රතිඵලයක් ලෙස පාලක පන්තියෙන්ම නව ආගමික දර්ශනයක් සොයායෑම දක්නට ලැබිණ.

ක්‍රිස්තු පූර්ව 599 පමණ වන විට ලිච්චවී ගෝත්‍රයේ වෛශාක්‍ය ග්‍රාමයේ සිද්ධාර්ථ නම් පාලකයාගේ සහ ක්‍රිසලා දේවියගේ තිස් හැවිරිදි පුත් මහාවීර ගිහිගෙය හැර යන අතර නව දහමක් සොයා පැමිණෙන අධිෂ්ඨානයෙන් යුතුව වසර දහතුනක් දුෂ්කර ක්‍රියා කිරීමෙන් අනතුරුව සල්ගසක් පාමුල දී කෙවලතා ඥාණය ලබා මොහු ජෛන මහා වීර බවට පත් වූ අතර ඔහු විසින් මගධය අංග, කොසඹෑ යන රාජ්‍යවල තම ධර්මාශ්‍රම පිහිටුවා ධර්ම දේශනා කළ අතර එමඟින් යම් තරමකට බ්‍රහ්ම ආගමෙන් එල්ල වූ තර්ජනය අවමකර හැකි විය. වසර 72ක් ජීවත් වූ ජෛන මහාවීර, ජෛනාගම මහා භාරතය තුළ ස්ථාපිත කළ අතර ඔහු උග්‍ර අවිහිංසාවාදීයෙක් විය. බ්‍රහ්ම මැවුම්වාදය තුළ තිබූ බිලි පූජා වෙනුවට ඔහු සියලු සතුන්ට අභය දානය දුන් අතර ඇඳුම් ඇඳීම පවා ප්‍රතික්ෂේප කළේය. ඉන්දියානු සමාජය තුළ ඔහු ප්‍රකට වූයේ නිගණ්ඨනාථපුත්ත ලෙසය. වර්තමානය වන විට මොහුගේ ආගම සැලකිය යුතු ලෙස ඉන්දියාව තුළ ස්ථාපිතව ඇති අතර එය දැනට නිකාය දෙකකට (දිගම්බර සහ සීතාම්බර) වෙන් වී ඇත. සීතාම්බර නිකාය සුදු පැහැති වස්ත්‍රාභරණවලින් සැරසෙන අතර දිගම්බර නිකාය අහස තම සළුව ලෙස සලකා නිර්වස්ත්‍රව ජීවත් වේ.

මෙසේ ගමන් කරවූ ඉන්දියානු පන්ති සමාජය තුළ ජෛනාගම බිහිවුවද ඔවුන්ට බ්‍රහ්ම මැවුම්වාදයේ තිබූ සියලු කරුණු පරාජයට පත් කිරීමට නොහැකි විය. එනිසා නව ආගමික දර්ශනයක අවශ්‍යතාවය ජෛනාගමටද ඉටු කළ නොහැකි වූ නිසා නව ආගමික දර්ශනයක අවශ්‍යතාවක හිඩැස දැඩිව දැනෙන්න විය. බ්‍රහ්ම මැවුම්වාදය විසින් ආර්ථිකමය අගාධයකට ඇද දමා තිබූ ඉන්දියානු සමාජය සහ කුල පීඩිත ඉන්දියානුවන්ට ජෛනාගම විසින් ඔහුගේ බලාපොරොත්තු ඉටුකිරීමට නොහැකි වූ අතර සමාජ පීඩනය ඉන්දියානු පන්ති සමාජය නව ආගමක් ජනිත කරවීමේ විලිරුදාවෙන් පෙළෙන්නට විය. මෙවන් පසුබිමක් තුළ දී බ්‍රහ්ම මැවුම්වාදය සහ ජෛනාගම පැවැති උග්‍ර අවිහිංසාවාදය වෙනුවට ඉන්දියානු ආර්ථික මොඩලය වෙනස් කරවිය හැකි ආගමක් ලෙස ක්‍රිස්තු පූර්ව 563 දී බුද්ධාගම බිහිවීම සිදුවිය.

කිඹුල්වත්පුර පාලක සුද්ධෝදන සහ මහමායා දේවියගේ පුත් සිදුහත් විසින් ගිහිගෙය හැරගොස් දුෂ්කර ක්‍රියා කොට වසර හයකට පසුව නේරංජනා ගඟ අසබඩ බෝ රුකක් පාමුලදී සර්වඥතා ඥානය ලබාගන්නා බව ප්‍රකාශ කිරීමත් සමඟ බුද්ධාගම බිහිවීම සිදුවිය. එය ජෛනාගම සමඟ සංසන්දනය කිරීමේදී ලිබරල්වාදී බවක් පෙන්නුම් කරන අතර එමඟින් බ්‍රහ්ම මැවුම්වාදය සහ ජෛන අහිංසාවාදය කෙමින් ප්‍රතික්ෂේප කළේය. උත්පත්තියේදී කිසිදු පුද්ගලයකු වසලයකු හෝ දෙවියකු නොවන අතර ක්‍රියාවෙන් පමණක් පුද්ගලයකු වසලයෙකු හෝ දෙවියෙකු වන බවත් යම්කිසි කෙනෙකුට අවශ්‍ය නම් මාංශ අනුභව කළ හැකි බවත් ප්‍රකාශ කළ අතර කර්මවාදය සහ හේතුඵලවාදයද එහිදී දේශනා කරන ලදී. ඉන්දියානු පංති සමාජයේ පැවැති කුල පීඩික භාවයට බෞද්ධාගම විසින් යම් සාධාරණත්වයක් ඉටු කරන අතර බෞද්ධාගම ඕනෑම කෙනෙකුට ඇදහීම සහ ශාස්තෘවරයෙකු වීමට කුලය අවශ්‍ය නොවන බව ප්‍රකාශ කළ අතර කාලයක් ගතවීමත් සමඟ කාන්තාවන්ටද එහි ශාස්තෘවරුන් බවට පත්විය හැකි වූ බව පෙන්වීම තුළින් එය බ්‍රහ්ම සහ ජෛනාගම අභිබවමින් ඉන්දියානු පන්ති සමාජය තුළ ඒ වන විට ජනප්‍රියම ආගමට බවට පත්විය. එසේම ඉන්දියානු සමාජය තුළ පැවති රාජ්‍යයන් තුළ රාජ්‍ය ආගමට බවටද බුද්ධාගමට පත්වීමට හැකි විය.

**උත්පත්තියේදී කිසිදු පුද්ගලයකු වසලයකු හෝ දෙවියකු නොවන අතර ක්‍රියාවෙන් පමණක් පුද්ගලයකු වසලයෙකු හෝ දෙවියෙකු වේ.**



# දකුණු කොරියාවේ නිෂ්ශබ්දතාවයේ දවස



එය දකුණු කොරියානුවෝ හඳුන්වන්නේ කුප්‍රකට සුනියන් දිනය ලෙසයි. එය සෑම වසරකම නොවැම්බරයේදී උදාවෙන අතර මාසයේ දිනය පමණක් වෙනස් විය හැක. එය මොනතරම් නම් සුවිශේෂී දිනයක්ද යත් දකුණු කොරියාවේ හදවත බඳු කොටස් වෙළඳපොළ පටන් ගන්නේ ප්‍රමාදවය. සියොල් නුවර ගුවන් යානා අහස කරා නොනගී. සියලු සාප්පු සංකීර්ණ අගුලුලයි. සියොල් නුවර සියලු යුධ අභ්‍යාස නවතී. බැංකුද නිවාඩුය. මහාපරිමාණ ඉදිකිරීම් නවතා දමයි. මහා මාර්ගයේ වාහන ගමනාගමනය සීමාකරන අතර වාහන තදබදය සහ නලා හැඬවීම අවම කරනු වස් උමං මාර්ග හා වෙනත් විකල්ප මාවත් භාවිතා කරන ලෙස බලධාරීන් සියලු රියදුරන්ට උපදෙස් දෙයි.

මේ සියල්ල කුමක් සඳහාද.? දකුණු කොරියානු සිසුනට නිදහසේ සිය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා තෝරාග නු ලබන තීරණාත්මක විභාගයට හිත සැහැල්ලුවෙන් ඉඳගැනීමටය. එහි පැවැත්වෙන්නේ එක විෂයයකි. එය කොරියානු භාෂාව පමණකි. තමාට කැමති විෂය ධාරාව ඔවුන් තෝරාගන්නේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සමත්වූ පසුය. මේ වසරේ නොවැම්බර් 15 දින එය පැවැත්විණි. ලක්‍ෂ හයක් සිසු සිසුවියෝ ඊට මුහුණ දුන්හ. එය දකුණු කොරියානු සිසුවාගේ අනාගතය තීරණය කරන දවසයි. යම් සිසුවෙක් විශ්වවිද්‍යාලයකට සමත්වනවා යනු ඔහුගේ අනාගතය අතිශය සුරක්‍ෂිත අනාගතයක් යනුවෙන් කොරියානුවෝ විශ්වාසය පළකරති. රාජ්‍ය අනුග්‍රහය පවා මේ සිතිවිල්ල පෝෂණය කරයි. ඉනුත් කොරියාවේ Eun Suh, Sky සහ Yonsei විශ්වවිද්‍යාල ත්‍රිත්වය ඔවුහු ලෝකයේ කේම්බ්‍රිජ්, ඔක්ස්ෆර්ඩ්, යෙල් සහ හාවඩ් විශ්වවිද්‍යාල සේ සළකති, පිළිගනිති. ගිය වසරේ නොවැම්බර් 15 දින ලක්ෂ හයක් දරු දැරියෝ විභාග යට පෙනී සිටින විට තවත් ලක්ෂ 12ක් ඔවුන්ගේ මාපියන් පන්සල් හා කෝවිල් වෙත ගොස් තම දරුවා සමත් කර දෙන ලෙස ඉල්වමින් නොයෙකුත් පුද පූජා පැවත්වූහ. කෝටින්ම එකම එක දිනයකදී ලක්ෂ 18ක් දෙනා ආතතියෙන් පෙළෙති. මෙය දකුණු කොරියවේ ඛේදනීය තත්වයක් බවත්, නිහඬ ඛේදවාචකයත් බවත්, රටේ ආර්ථික හා මානසික වර්ධනයේ බිඳවැටීමක් බවත් බහුතර මහාචාර්යවරුන්ගේ හා ආර්ථික විශේෂඥයන්ගේ මතයයි. එහෙත් කළ හැකි වෙනත් පිළිමයක් නැත. තරගය එතරමටම ප්‍රබලය.

එහෙත් දකුණු කොරියානු රැකියා වියුක්තියේ සංඛ්‍යා ලේඛන පරීක්‍ෂා කළ හොත් රැකියා වියුක්තිකයන් හතර දෙනෙකුගෙන් එක් අයෙක් උපාධිධාරියෙකි. දරු දැරියන් විශ්වවිද්‍යාලයට තෝරා ගනු ලබන මෙම තරඟ විභාගය නිරීක්ෂණය කිරීම සඳහා ඔවුහු 500ක් ගුරුවරු තෝරා ගනු ලබන අතර විභාගය පැවැත්වීමට මසකට පෙර ඔවුන්ගේ සියලු නිවාඩු අවලංගු කොට, කිසිවෙකුට තම නිවෙස්වෙත යාම තහනමට ලක්කොට ඈත කඳුකරයේ නම නොදන්නා ස්ථානයක රඳවා තබති. පුරා මාසයක් ඔවුන්ට අන්තර්ජාලය තහනම් කර සියලු ජංගම දුරකතන රාජසන්තකයට ගෙන සියලු බාහිර සම්බන්ධතා අවහිර කරයි. විභාගයේ රහස්‍යභාවය එතරම් දැඩිය. තියුණුය. විභාග මධ්‍යස්ථානයට ඇතුලුවන විට කිසිදු ලෝහමය ද්‍රව්‍යයක්, දුරකතනයක්, පොතක් පතක් ගෙන ඒමට හෝ අත් ඔරලෝසුවක් පවා පැළඳීමට දරුවාට තහනම් කරනු ලබයි. මේ අසාමාන්‍ය තරඟකාරී විභාගයට මුහුණදීම සඳහා එරට සිසුවෝ ඊට වසර 4කට පෙර සිටම ලක ලැහැස්ති වෙති. ඔවුහු උදේ 7ට පාසැල් යන අතර පාසැල නිමාවී පැමිණ උපකාරක පන්තිවල රාත්‍රී 9 දක්වා ගත කරයි. ඉන් අනතුරුව Hagwons නැමති අතිශය ජනප්‍රිය පුද්ගලික ගුරුවරු විසින් උගන්වන අන්තර්ජාලයේ පන්තිවලට සහභාගි වෙති. එය රාත්‍රී 11ට අවසන් වේ.

දකුණු කොරියාවේ අධ්‍යාපනය පුද්ගලීකරණය කර ඇති නිසා තම දූ දරුවන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා බහුතර කොරියානුවන්ට අසාමාන්‍ය පිරිවැයක් දැරීමට සිදුවේ. ඔවුන්ගේ සාමාන්‍ය ජීවිතයේ වැඩිම මුදලක් වැයවන්නේ තම දූ දරුවන්ට අධ්‍යාපනය ලබාදීමටය. එය ඉතා ඉහළ අගයකි. එහි අගය කොතෙක්ද යත් ස්මාට් ස්කූල් නැමති පුද්ගලික පන්තිවල ගුරුවරුන් වසරකට උපයන මුදල ඩොලර් බිලියන 20කි. අධ්‍යාපනයේ මේ අධික පිරිවැය නිසා බොහෝ දෙමව්පියෝ සිය දරු උපත් සීමා කරති. ලෝක උපත් අනුපාත දර්ශකයේ දකුණු කොරියාව තිබෙන්නේ බොහෝ පහතිනි. මෙයට පිළියමක් ලෙස 2018 වර්ෂයේ සිට කොරියානු රජය සෝල් නුවර සියලු පුද්ගලික පාසැල්වලට එක් ළමයෙක්ගේ අධ්‍යාපන කටයුතු සඳහා රජයේ අවම මිලක් තීරණය කර ඇත.

පුරා වසර හතරක් සිය විශ්වවිද්‍යාල ප්‍රවේශයට සූදානම් වන දරුවා උදේ සිට රාත්‍රී 11 දක්වා අධ්‍යාපනයට සීමා වෙයි. ඔවුහු සිය යාලු මිත්‍රයන්ගේ ඇසුර අතිශය සීමා කරති. ඥාතීන් මුණ ගැසීම වර්ජනය කරති. සමහර විට ඔවුහු පාඩම් කරන්නේ කාමරවල අගුලු දමාය. අතිශය හුදෙකලා පරිසරයක් තමා අවට ගොඩනගා ගන්නා දරුවා තමන්ගේ ලෝකයේ තනිවෙයි. කාන්සියෙන් වෙහෙසට පත්වෙයි.” නිසා වෙහෙස මහන්සි වී ලබන විශ්වවිද්‍යාලයට ඇතුලත් වීමේ විභාගය තමා අසමත් වූ බව දැනගත් විට ඡේ සිය දිවි නසා ගනී. ආසියාවේ වැඩිම සියදිවි නසා ගන්නා රට ජපානය වන අතර දෙවැනි ස්ථානය දකුණු කොරියාව වේ. කොරියානු රජය දෙමවුපියන්ගේ මෙන්ම දරුවන්ගේ මානසික මට්ටම ඉහළ නැංවීම සඳහා විවිධ ප්‍රචාරණයන් සිදුකරයි. ඔවුහු මානසික ප්‍රතිකාර සඳහා වසරකට බොහෝ රෝහල්වල සායනයන් විවෘත කරන අතර ඒවායේ ඇඳන් සංඛ්‍යාව නිරන්තරයෙන් ඉහළ දමයි. එහෙත් වසරින් වසර වයස අවුරුදු 10ත් 30ත් අතර තරුණ දරුවෝ සිය දිවිනසා ගැනීමේ වර්ධන වේගය දකුණු කොරියාවේ ඉහළ අගයක් ගනී.

] උපාලි ජයසිංහ [

# ධනවාදයට හසු නොව...

09 පිටුවෙන්...

වෙත ඌණනය කරමින් මිලදී ගත යුත්තක් ලෙස ධනවාදී සමාජ රාමුව ඉදිවෙමින් පවතී. විටින් විට ඇසෙන සමකාලීන පුවත් බොහෝවිට ඉලක්ක වන්නේ පවුල නැමති ඉදිකිරීම හේතුවෙන් ආගමික, සංස්කෘතික හා සාමාජීය වශයෙන් සීමාවූ මානවයාගේ යටපත් කරන ලද අව්‍යාජ ස්වරූපයයි.

අඹුසැමියන් ලෙස පවුල් ජීවිත ගත කරනවුන් ඔවුනොවුන්ව යලි කිසිදා නොදකින ආකාරයට වෙන්වීමට දරණ උත්සාහය හා ඒ වෙනුවෙන් සිදුකරන සැලසුම් පුදුම සහගතය.

“පන්නල, වෙල්පල්ල ප්‍රදේශයේදී අඹු-සැමි යුවලක් අතර ඇති වූ බහින් බස්වීමක් දුරදිග ගොස් සැමියා විසින් නිවස ඉදිරිපිටදී සිදුකළ පහරදීමකින් බිරිඳ මියගොස් තිබේ.”

“දඹුල්ල, ගෝණාවැව කැළෑවක් තුළ පුද්ගලයෙකු ටයර් දමා පුලුස්සා ඝාතනය කර ඇත. සිද්ධියට සම්බන්ධ බව කියන ප්‍රධාන සැකකරු මියගිය රියදුරාගේ බිරිඳ සමඟ අනියම් සම්බන්ධතාවයක් පවත්වාගෙන ගොස් ඇති බවද පොලිස් ප්‍රශ්න කිරීම්වලදී අනාවරණය වී තිබෙනවා”.

මෙහිදී අපට ඇසීමට සිදුවන ප්‍රශ්නය නම්, විවාහ වීම මිනිස් අයිතියක් ලෙස තහවුරු කර තිබුණ ද පවුල නැමති ගොඩනැගීමට එකිනෙකා ඝාතනය කිරීම හැර විකල්ප නොමැති තත්වයකට පත්වන්නේ කෙසේද යන්නයි. කලාත්මක ප්‍රවේශයකින් මෙකී විවාහයේ දෛනිකත්වය හා ඒ හා සම්බන්ධ වියවුල ප්‍රකාශ කර තිබූ සමකාලීන චිත්‍රපටයක් ලෙස මලිත් හෑගොඩ විසින් අධ්‍යක්ෂණය කරන ලද “දැකලා පුරුදු කෙනෙක්” සිනමාපටය හඳුනාගත හැක. විවාහ ජීවිතවල සැබෑ ගැටලුව අප වෙත අභිමුඛ කරවන එම සිනමාපටය සැකය, සමාව නොදීම, බය, අපේක්ෂාභංගත්වය, අනියම් සම්බන්ධතා ආදී පවුල් ජීවිතය තුළ ඇතිවන, සමාජය විසින් හෙළා දකිමින් යටපත් කරන මානව ලක්ෂණයන්ගේ නොවැලැක්විය හැකි ස්වභාවයන් සාමාන්‍යකරණය කරයි. මෙවැනි සිනමා නිර්මාණයන් තුළින්ද ඒත්තු ගැන්වන්නේ, ධනවාදය නම් වූ ශිෂ්ට නොවන අරමුණක් වෙනුවෙන් ශිෂ්ටත්වයක් බලයෙන් ආරෝපණය කිරීමට යාමේ වියවුල වෙනදාටත් වඩා හඳුනාගැනීමට හැකි මොහොතකි.

] චාමනී දර්ශිකා [

ඒ පාරෙත් මේ පාරට...

# මිසයිල වෙනුවට වෛද්‍ය සේවය



"කියුබාවේ Mambisasa සහ Abdala අපේක්ෂිත එන්නත්වල සායනික අත්හදාබැලීම් සිදුකිරීමට අනුමැතිය හිමිවේ."

සමාජවාදී රටක් වන කියුබාව පිළිබඳ පළවන නවමු පුවත එයයි. වසරකට ආසන්න කාලයක් මුලු ලොවම එක්තැන් කළ, ධනවාදය විතැන් කළ කොවිඩ් වසංගතයට එරෙහිව කියුබාව අවි ඔසවා තිබේ!. කොවිඩ්-19 රෝග ලක්ෂණවලට ප්‍රතිකාර කිරීමේදී යොදා ගන්නා ඉන්ටෆෙරොන් ඇල්ෆා 2-ඊ ප්‍රතිජීවකයද ඇතුළු ප්‍රතිජීවක ඖෂධ 22ක් සමාජවාදී කියුබාව විසින් මේ වනවිට නිපදවා ඇත.

ඉහළම තාක්ෂණයෙන් මිසයිල දියත්කරන, 'ලෝක බලවතුන්' සේ සැළකෙන එක්සත් ජනපදයේ සහ යුරෝපයේ සෞඛ්‍ය සේවා තම රටේ පුරවැසියන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබාදීමට අසාර්ථක වූ කාල වකවානුවක, සමාජවාදී කියුබාව සිය වෛද්‍යවරු කණ්ඩායම් රට රටවලට යවමින් කොරෝනා මර්ධනය සඳහා ජාත්‍යන්තරවාදී මෙහෙයුම්වලද නිරත වී සිටින්නේ කොවිඩ් මර්ධන මෙහෙයුමේ පෙරමුණ ගනිමිනි. වර්ෂ 1959 සිට 325,000කට වැඩි කියුබානු සෞඛ්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයන් ප්‍රමාණයක් මෙසේ ලොවපුරා රටවල් 158ක මෙහෙයුම්වලදී තම දායකත්වය ලබාදී ඇත.

ජනතාවට වඩා ලාභය, පුද්ගලික වරදාන මූලික වූ බහුතර ධනවාදී ලෝකයක් අභිමුව විද්‍යාව හා තාක්ෂණයේ දියුණුව මිනිසා වෙනුවෙන් යොදාගැනීමේ කියුබානු මෙහෙයුම අති සාර්ථකය. ඔවුහු වැපිරුවේ වෛද්‍යවරුය. රෝගීන් සංඛ්‍යාවට ලොව ඉහළම වෛද්‍යවරුන් අනුපාතය (ආසන්න වශයෙන් රෝගීන් 100කට එක වෛද්‍යවරයෙකු), එනම් සෑම පුරවැසියන් 1000කටම වෛද්‍යවරුන් 09ක් සිටින්නේ කියුබාවේය. එය එක්සත් ජනපදයේ අගය මෙන් දෙගුණයකි. එච්.අයි.වී. හා සිපිලිස් මවගෙන් දරුවාට බෝවීම මුලිනුපුටා දැමූ ලොව පළමු රටද කියුබාවය. එහි ළදරු මරණ අනුපාතය එක්සත් ජනපදයේ අගයට වඩා අඩුය. මේ සමාජවාදී කියුබාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය දිනාගත් ජයග්‍රහණ පොතේ එක් පිටුවක් පමණි.

මේ වන විට කියුබානුවන්ට හා විදේශීය ශිෂ්‍යයන්ට කිසිදු ගාස්තු අයකිරීමකින් තොරව පුහුණුව ලබාදෙන වෛද්‍ය පුහුණු ආයතන 23ක් කියුබාව තුළ ස්ථාපිත කර ඇත. මිසයිල වෙනුවට සමාජවාදය විසින් බිහිකළේ සමාජය සුවපත් කරන මිනිසුන්වය.

මින් වසර 62කට පෙර සමාජවාදී විප්ලවය ජයග්‍රහණය කළ කියුබාව අදටත් ජයකෙහෙළි නගන්නේ යල්පැනගිය ධනවාදයට ඉහළින් සමාජවාදයේ ශ්‍රේෂ්ඨත්වය අන් කවරදාටත් වඩා ඔප්පු කරමිනි. අසමත් ධනවාදය අබිමුව ඇති විකල්ප මග සමාජවාදයම බව පසක් කරමිනි..

වමට

# 'මානව හිමිකම්' ධනවාදයේ හිස් වචන!



පසුගියදා මහර බන්ධනාගාරයේදී රැඳෙවියන් 11ක් ඝාතනය කෙරුණේ තවත් රැඳෙවියන් 106 දෙනෙකුට තුවාල සිදුකරමින්ය. මේ සිදුවීමත් සමඟ බන්ධනාගාර හා බන්ධනාගාරගත රැඳෙවියන් පිළිබඳ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල මෙන්ම සමාජ මාධ්‍ය තුළද විවිධ මත පලවන්නට විය. බෝහෝ පිරිසකගේ අදහස්වල ගැබ් වූයේ "හිරේ ගියේ වරදකරුවන් නිසා මරා දැමුවාට කම් නැත" යන්නය. නමුත් "සිරකරුවෝද මනුෂ්‍යයෝය" යන හැඟීමෙන් පෙර මතයට විරුද්ධ මත දැරූ 'මිනිසුන්ද' සිටියෝය.

අපේ රටේ බන්ධනාගාර තුළ සිටින රැඳෙවියන් ප්‍රමාණය සීමාව ඉක්මවා ගොස්ය. 2020දී එය 185.9%කි. මහර බන්ධනාගාරයේ රැඳවිය හැකි ප්‍රමාණය 1000ක් වුවත්, දැනට සිටින ප්‍රමාණය 25000 අධිකය. 1000කට සරිලන පහසුකම් සහිත බන්ධනාගාරයක කෝවිඩ් ආසාදිත රැඳෙවියන් සමඟ 2500ක් දැමූ විට තත්වය කෙසේ විය හැකිද?.

1955 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය සිරකරුවන්ටද මනුෂයන් ලෙස සැලකීමට ප්‍රඥප්ති සැකසුවේය. ලංකාවද ඒ ප්‍රඥප්තියට එකඟ වී තිබේ. නමුත් ධනේශ්වර ලෝකය මානව හිමිකම් පිළිබඳව කතාකිරීමම විහිලුවක් බවට පත් කර ඇත. මන්ද යත්, ධනේශ්වර ලාභය උපදින්නේම මිනිස් අයිතියක් වූ ශ්‍රමයට සරිලන වැටුප නොගෙවා සූරාකෑම හරහාය. එනම් ධනේශ්වර ලාභය උපදින්නේම, ධනවාදය හුස්මගන්නේම මානව හිමිකම් උල්ලංඝනය කරමින්ය. ලාභය උදෙසා යුද්ධ නිර්මාණය කර මිනිසුන් මරා දමන්නේද, පසුව මානව හිමිකම් උල්ලංඝනය වූවා යැයි පවසමින් එම රටවල් බලහත්කාරයෙන් තමන් සතු කරගන්නේද මේ ධනේශ්වර ලෝකයමය. මිනිස්සුන්ට ලෙඩ රෝග, වෛරස් බෝකර මිනිසුන් මරා දමා, ඒ සඳහා බෙහෙත් නිෂ්පාදනය කර ලාභ උපයන්නේද මේ ධනේශ්වර ලෝකයමය. එනිසා ධනේශ්වර ලෝකයෙන් මානව හිමිකම් බලාපොරොත්තු වීම විහිලුවකි!.

එසේ තිබියදී ලංකාවේ ධනේශ්වර පාලකයින්ගෙන් මානව හිමිකම් ඉල්ලාසිටීම විහිලුවක් නොවන්නේද..? මානව අයිතියක් වූ 'සැමට සමාන අධ්‍යාපන අවස්ථා' අහිමිය. උසස් අධ්‍යාපන අවස්ථා සඳහා සුදුසුකම් සැපිරුවද උසස් අධ්‍යාපන අවස්ථා අහිමිය. රැකියා කළ යුතු වයසේ තරුණ ප්‍රජාවට රැකියා අවස්ථා අහිමිය. රැකියා කළද කම්කරු අයිතිවාසිකම් අහිමිය. ආදරය, අත්‍යාවශ්‍ය මානව හිමිකමක් වුවද මිල මුදල්වලින් බාධා කොට ආදරය පවා අහිමි කොට ඇත. පිරිසිදු වාතය ආශ්වාස ප්‍රාශ්වාස කිරීමේ හිමිකම දූෂණය කොට ඇත්තේ දැවැන්ත පරිසර විනාශයක් සිදුකරමින්ය. මිනිසුන්ට මිනිසුන් ලෙස තීරණගැනීමේ තනි අයිතියද පැහැරගෙන ඇත්තේ ධනවාදී පාලකයින්ගේ බල උවමනාවන් උදෙසාය. එමෙන්ම සියලු මිනිස් ශ්‍රමයේ ආදායම වූ ජාතික ආදායමද කොල්ලකමින් මිනිසා සතු සියලු හිමිකම් පැහැරගෙන ඇත්තේය.

මෙලෙස සියලු හිමිකම් පැහැරගත් සමාජයක මිනිසුන් ප්‍රචණ්ඩකාරී වන්නේය, කුට හා වංචාකාරී වන්නේය. අපේක්ෂාභංගත්වයට පත් වූ මත් ලෝලීන් වන්නේය. එය ඔවුන්ගේ පුද්ගලික වරදක් නොව මේ අසමත්, පසුගාමී, සිත්පිත් නොවූ ධනේශ්වර සමාජ ක්‍රමයේම වැරද්දකි. ධනේශ්වර ක්‍රමය විසින් මිනිස් සමාජය බිත්ති හතරකට සීමා කර නොතිබුණද මුලු සමාජයේම මානව හිමිකම් අහුරා ඇත.

එවන් සමාජයක, මේ සමාජ ක්‍රමයේම වරදින්, වැරදිකරුවන් වූ බන්ධනාගාර රැඳෙවියන්ට මානව අයිතිවාසිකම් හිමිවිය යුතුමය. ධනේශ්වරයේ කැත වැසීමට "සිරකරුවෝද මනුෂ්‍යයෝ වෙති" යනුවෙන් සිරගෙදර තාප්පයට සීමා වූ ලස්සන වැකි ගැසීම වෙනුවට මිනිසුන් ලෙස ඔවුන්ට ඔවුන්ගේ අයිතීන් ලබාදිය යුතුය.

එබැවින් සැබෑ ලෙසටම නිවැරදි විය යුත්තේ සිරගතවූවන් නොව, මිනිසුන් අපේක්ෂාභංගත්වයට පත් කරන, මිනිසුන් හොරුන් හා වංචාකරුවන් බවට පත් කරන, මිනිසුන් නොමිනිසුන් හා නරුමයන් බවට පත් කරන මේ අදූරදර්ශී, අසමත් ධනේශ්වර පාලනයමය.

කරක් ගහපු තැන



# මිනී ඇල්ල

අයගම කියන්නේ සබරගමුවට අයත් රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි සුන්දර නගරයක්. කොළඹට පැය කිහිපයකින් ළඟා විය හැකි සමශීතෝෂ්ණ දේශගුණයකින් සමන්විත මේ ප්‍රදේශයත් ලංකාවේ සුන්දර ප්‍රදේශයන් ගොන්නට ලඝු කරන්නට පුළුවන් බවයි මට නම් හැඟෙන්නේ. අයගම හැඩකරන දියඇලි දෙකක් හොයාගෙන පසුගිය දවසක අපි ඒ ප්‍රදේශයේ සංචාරය කළා. ඉන් එකක් තමයි මිනී ඇල්ල කියන්නේ. තවමත් සංචාරකයන් අතර එතරම්ම ජනප්‍රිය නොවූ මිනී ඇල්ලට ළඟාවීමට නම් පල්ලෙකඩ හන්දියෙන් ගමික්කන්ද මාර්ගයේ ගමන් කළ යුතුයි.

පාලමක් යටින් ගලායන ජලය තරමක විශාල ගල් තලාවක් මතින් පහළට ඇද හැලෙනවා. වර්ෂාව අඩු කාලයකදී කිතුල් රෑනක් සේ ජලය පහළට ඇද හැලෙන අයුරු ගල් තලාවේ සිට නරඹන්න පුළුවන්. පාලමේ සිට මීටර 150ක පමණ දුරක් පහළට බහිනකොට ඇල්ල සම්පූර්ණයෙන්ම දර්ශන පථයට හසු වෙනවා.

උසට සාපේක්ෂව පළලින් වැඩි දිය ඇල්ලක් ලෙස හඳුනාගත හැකි මිනී ඇල්ල මාතලේ පිහිටි සේර ඇල්ලට සමානකමක් දක්වනවා කිව්වොත් නිවැරදියි. අයගම නයගරාව ලෙස හඳුනාගන්නවා නම් ඊට වඩා සුදුසුයි කියලයි මට නම් හිතෙන්නෙ. මිනී ඇල්ලෙ උස මීටර් 8ක් හෝ 10ක් විතර ඇති. ගම්මුන්ට අනුව නම් මෙය ඇලි දෙකක් විදිහට ඇද හැලෙනවා.

ගමේ අය බොහෝ දෙනෙක් ස්නානය කිරීමටත්, රෙදි සේදීමටත් වැනි පොදු අවශ්‍යතා සඳහා එන්නේ මෙතනට. ආරක්ෂිතව දිය නෑමට සුදුසු ස්ථාන ඇල්ලට මදක් ඉදිරියෙන් තිබුනත් ජලය වැටෙන ස්ථානය නෑමට එතරම් යෝග්‍ය නොවන බවයි පැවසෙන්නේ. එම ස්ථානය තරමක ගැඹුරින් යුක්ත බවත් අපරීක්ෂාකාරීව දියනෑමට ගොස් කිහිපදෙනෙක්ම ගිලී මියගිය බවත් ගම්මුන් අපට පැවසුවා. ඒ හේතුවෙන් මේ නම පට බැඳී ඇති බව දැනගන්නට ලැබුණා. දියනෑමේදී ජීවිත ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වන්න. ඒ අපි ඔබට දෙන අවවාදය!.

කැලෑ හෙළි කරමින් විවිධ වගා කටයුතු මේ ප්‍රදේශය අශ්‍රිතව සිදුකරන නිසා මිනී ඇල්ලට අත්වෙලා තියන ඉරණම ශෝචනීය බව ගම්මුන් පවසනවා. නියං සමයට ඇල්ලේ එක් පසෙකින් පමණක් ජලය කඩා වැටෙන අතර එයද සිහින් දිය දහරාවක්. ඔබත් මිනී ඇල්ල නැරඹීමට යන්නේ නම් සංචාරකයින්ගේ සදාතනික නියමය වන පා සටහන් පමණක් ඉතිරි කර පැමිණීමට වගබලා ගන්න.

] ගයාන් තුදුස්ක [

## රජපීල්ල උද්‍යානය විනාශයට එරෙහිව උද්ඝෝෂණයක්...




කුරුණෑගල රජපීල්ල උද්‍යානය විනාශයට එරෙහිව සමාජවාදි තරුණ සංගමය විසින් පසුගිය ජනවාරි 6 වැනිදා උද්ඝෝෂණයක් පැවැත්විය. කොවීඩ් වසංගත තත්වයැයි පවසමින් උද්ඝෝෂණය පැවැත්වීමට එරෙහිව අධිකරන නියෝගයක් කුරුණෑගල පොලිසිය විසින් ලබා ගෙන තිබූ අතර එම උද්ඝෝෂණය වෙනත් ස්ථානයක පවත්වන ලදී.

ඒ සදහා ජවිපෙ මධ්‍යම කමිටු සාමාජික නාමල් කරුණාරත්න, සමාජවාදී තරුණ සංගමයේ ජාතික කමිටු සාමාජික සංජය විශ්වනාත්, කුරුණෑගල මහ නගර සභාවේ ජවිපෙ නාගරික මන්ත්‍රී රනුක ධංජය, සමාජවාදි තරුණ සංගමයේ දිස්ත්‍රික් සංවිධායක නිලන්ත බංඩාර, ඉබ්බාග මුව ප්‍රාදේශීය සභාවේ ජවිපෙ මන්ත්‍රී දිලිප්, වැදන්ඩේ රතන ජෝති හිමි, හෑලව සිරිධම්ම හිමි ඇතුළු තරුණ තරුණියන් සහභාගි විය.

## SYU හා පලස්තීන තානාපති අතර හමුවක්



සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර , එහි ජාත්‍යන්තර කටයුතු ලේකම් අංජන සම්පත් අමරසිංහ යන සහෝදරවරුන් හා පලස්තීන තානාපති කාර්යාලයේ දෙවන ලේකම් හිසාම් අබු ටහා මහතා සමග හමුවක් දෙසැම්බර් 09 කොළඹ පිහිටි පලස්තීන තානාපති කාර්යාලයේ දී පැවැත්විණි .

එහිදී දෙරටේ වර්තමාන දේශපාලන තත්ත්වය හා ඉදිරි කටයුතු පිළිබඳවද, විශේෂයෙන් ඇමෙරිකා එක්සත් ජනපද ජනාධිපතිවරණයෙන් පසු පලස්තීන - ඊශ්‍රායල් අර්බුදයට අදාළව ඇතිව තිබෙන සාධනීය වෙනස්කම් ගැනත් කතා බහට ලක් විණි .දශක ගණනාවක් පුරා පලස්තීන ජනතාව ගෙනයන යුක්ති සහගත සටන පිළිබඳ වත්, ඊට ජාත්‍යන්තර ප්‍රජාව ලබා දෙන ලබාදෙන සහයෝගය පිළිබඳව තවදුරටත් සාකච්ඡා කෙරුණු අතර සමාජවාදී තරුණ සංගමය විසින් පලස්තීනයට එරෙහි ඇමරිකා- ඊශ්‍රායල් මැදිහත්වීම් හෙළා දකිමින් සහයෝගිතා ප්‍රකාශයක් පලස්තීන තානාපති කාර්යාලයේ දෙවන ලේකම් හිසාම් මහතා වෙත ලබාදීම ද එහිදී සිදු විණි.

## බිම්තැන්නේ රක්ෂිත විනාශයට එරෙහිව



අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය පොල්ලෙබැද්ද ගම්මානය කේන්ද්‍ර කරගනිමින් අක්කර 5426ක් මේ වෙනවිට සමාගම් ගණනාවකට වර්තමාන ආණ්ඩුව විසින් ලබා දී ඇත. මෙම ඉඩම් මීට කලකට ඉහතදී මේ ප්‍රදේශයේ අහිංසක ගොවි ජනතාව හේන් ගොවිතැන් සඳහා භාවිතා කළ ඉඩම් වේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ජනතාව භුක්ති විදි මෙම ඉඩම් රඹකැන්ඔය ජලාශය රක්ෂිතයටයි පවසමින් මායිම් දමා ජනතාව ඉවත් කර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරා ගන්නා ලදී. දැන් මහ කැලයක් ඩෝසර් කරමින් විනාශ කරමින් පවතී. මෙම මහා විනාශය වලක්වා ගැනීම උදෙසා බින්තැන්නපත්තු සුරැකීමේ පෙරමුණ මේ වෙනවිට සුවිශාල කාර්යභාරයක් කරමින් සිටී. දෙසැ. 10 එම පෙරමුණේ ප්‍රධාන අනුශාසක සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ කාරක සභික හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත පියතිස්ස සහෝදරයා, පරිසරවේදී සජීව චාමිකර මහතා හා ප්‍රදේශවාසීන් එක්ව විනාශ කරමින් ඇති රක්ෂිත ප්‍රදේශ අධ්‍යනය කළෝය. එමෙන්ම බින්තැන්නපත්තුව සුරැකීමේ පෙරමුණ මගින් විරෝධතාවක්ද පැවැත් විය.

## සියළු දරුවන්ට අන්තර්ජාල අධ්‍යාපනය නොමිලේ ලබාදෙනු!




කොවිඩ් වසංගත තත්වය තුළ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු දැඩිලෙස අඩාල වී ඇත. එම නිසා සියළු දරුවන්ට අන්තර්ජාල අධ්‍යාපනය නොමිලේ ලබාදෙනු! මැයෙන් 11.12.2020 දින ඉසුරුපාය අධ්‍යාපන අමාත්‍යංශය ඉදිරිපිටදී ජනතා විමුක්ති පෙරමුණ විසින් පවත්වනු ලැබූ විරෝධතාවයට සමාජවාදී තරුණ සංගමය ද සහයෝගය ලබාදෙමින් ඊට සහභාගී විය.

## සියලු ජන කොටස්වල අයිතිවාසිකම් සුරකිනු!




ජාත්‍යන්තර මානව හිමිකම් දිනය වන දෙසැම්බර් 10, සියලු ජන කොටස්වල අයිතිවාසිකම් සහ නීතියේ ආධිපත්‍යය සුරකින ලෙස රජයට බල කරමින්, ප්‍රගතිශීලී ස්ත්‍රී එකමුතුව, අයිතීන් උදෙසා කාන්තාවෝ සහ අලුත් පියාපත් සංවිධානය ඇතුළු අනෙකුත් සිවිල් සංවිධාන සමඟ පාර්ලිමේන්තු වටරවුමේ දී විරෝධතාවයක් පවත්වන ලදි.

බොරැල්ල, සරණපාල හිමි මාවත, 45/95 බී, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.